# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,574 - 2008 ඔක්තෝබර් මස 31 වැනි සිකුරාදා - 2008.10.31

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡේදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 1338 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |
| ආණ්ඩුවේ නිවේදන ... ... ... | 1338 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 1341 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන *ගැසට්* නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට්* නිවේදන භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම්, පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙන සේ සකස් කරන මෙන් සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර - එනම් 2008 නොවැම්බර් මස 07 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යා යුතු දැන්වීම් 2008 ඔක්තෝබර් මස 24 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2008 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2008 අංක 604

DRF/21/RECT/2241.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක් සහ විශ්‍රාම ගැනීමක්

**නිල ස්ථිර කිරීම**

පහත නම සඳහන් නිලධාරියා 2005 නොවැම්බර් මස 29 වැනි දින සිට මේජර් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

නි/60364 කපිතන් (තාවකාලික මේජර්) බාලසූරිය අප්පුහාමිලාගේ අනිල් ශ්‍රියාරත්න, ශ්‍රීලකාහ.

**විශ්‍රාම ගැනීම**

පහත නම සඳහන් නිලධාරියා 2005 නොවැම්බර් මස 30 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

නි/60364 මේජර් බාලසූරිය අප්පුහාමිලාගේ අනිල් ශ්‍රියාරත්න, ශ්‍රීලකාහ

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 ඔක්තෝබර් මස 18 වැනි දින,
කොළඹ දී ය.

10-806

# ආණ්ඩුවේ නිවේදන

**ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනා කාර්යක්ෂම සේවා පදක්කම**

මෙහි වූ උපලේඛනයෙහි දක්වා ඇති පුද්ගලයින්ට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනා කාර්යක්ෂම සේවා පදක්කම ප්‍රදානය කිරීම අතිගරු ජනාධිපතිතුමා විසින් සතුටින් අනුමත කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

කොළඹ දී ය.

*උපලේඛනය*

2වන (ස්වේච්ඡා) බල ඇණිය - ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව
සෙ/2ඊ00219 බනි 1 ඩබ්එම්පීබී වීරකෝන් - 2 (ස්වේ)ශ්‍රීලංසිරෙ,
2වන (ස්වේච්ඡා) බල ඇණිය - ගැමුණු හේවා බලඇණිය,
සෙ/2එෆ්00237 බනි 1 ඩබ්පීඑම් චන්ද්‍රසිරි - 2 (ස්වේ) ගැහේබ,
15 වන (ස්වේච්ඡා) බලඇණිය - ගජබා රෙජිමේන්තුව,
සෙ/15ජී 01306 බනි 1 ආර්එම් සුමන බණ්ඩාර - 15(ස්වේ) ගරෙ,
10වන (ස්වේච්ඡා) බලඇණිය - විජයබාහු පාබල රෙජිමේන්තුව,
සෙ/10එච් 01370 බනි 1 ඩබ්ජ්එල් පුෂ්පානන්ද - 10 (ස්වේ) විපාරෙ.

10-807

**සමථ මණ්ඩල කොමිෂන් සභාව**

සමථකාරවරුන් ලෙස පත් කිරීම සඳහා නාම යෝජනා කැඳවීමේ නිවේදනය

1988 අංක 72 දරන සමථ මණ්ඩල පනතේ 5(1) වැනි වගන්තිය මගින් තමන් වෙත පැවරී ඇති බලතල පරිදි සමථ මණ්ඩල කොමිෂන් සභාව විසින් පහත සඳහන් සමථ මණ්ඩල පනතේ 1 වැනි උප ලේඛනයේ 6 වැනි වගන්තියේ සිට 11 වැනි වගන්තිය ප්‍රකාර ධුර හිස් කරනු ලබන සමථ මණ්ඩල සභාපති හා සමථකාරවරුන් සඳහා නැවත නාම යෝජනා කැඳවනු ලැබේ.

| *දිස්ත්‍රික්කය* | *සමථ මණ්ඩල ප්‍රදේශය* |
|---|---|
| කොළඹ දිස්ත්‍රික්කය | 01. මොරටුව |
| | 02. කැස්බෑව |
| ගාල්ල දිස්ත්‍රික්කය | 03. ඇල්පිටිය |
| | 04. යක්කලමුල්ල |
| | 05. අක්මීමන |
| | 06. බලපිටිය |
| මාතර දිස්ත්‍රික්කය | 07. මාතර |
| | 08. වැලිගම |
| හම්බන්තොට දිස්ත්‍රික්කය | 09. සූරියවැව |
| බදුල්ල දිස්ත්‍රික්කය | 10. රිදීමාලියද්ද |
| | 11. ඇල්ල |
| | 12. හල්දුම්මුල්ල |
| | 13. සොරණාතොට |
| | 14. ලුනුගල |
| රත්නපුර දිස්ත්‍රික්කය | 15. අටකලන්පන්න (කහවත්ත) |
| | 16. කුරුවිට |
| | 17. කිරිඇල්ල |

| දිස්ත්‍රික්කය | | සමථ මණ්ඩල ප්‍රදේශය |
|---|---|---|
| කෑගල්ල දිස්ත්‍රික්කය | 18. | වරකාපොල |
| | 19. | මාවනැල්ල |
| මහනුවර දිස්ත්‍රික්කය | 20. | පාතදුම්බර |
| | 21. | කුණ්ඩසාලේ |
| ගම්පහ දිස්ත්‍රික්කය | 22. | වැකේ (දොම්පෙ) |
| | 23. | කැලණිය |
| | 24. | බියගම |
| කළුතර දිස්ත්‍රික්කය | 25. | අගලවත්ත |
| | 26. | බණ්ඩාරගම |
| | 27. | හොරණ |
| | 28. | මතුගම |
| | 29. | පානදුර |
| කුරුණෑගල | 30. | මහව |
| පුත්තලම | 31. | කරුවලගස්වැව |
| | 32. | වෙන්නප්පුව |
| යාපනය දිස්ත්‍රික්කය | 33. | නල්ලූර් |
| | 34. | වේලනෙයි |

02. එකී සමථ මණ්ඩල සඳහා සමථකාරවරුන් පත්කිරීම පිණිස සුදුසුකම් ඇති තැනැත්තන්ගේ නම් ඉදිරිපත් කරන ලෙස මෙහි පහත සඳහන් කර ඇති (අ) පුද්ගලයින්ගෙන්, (ආ) මණ්ඩලවලින්, දේශපාලනමය නොවන සංවිධානවලින් සහ ආයතනවලින් හා (ඇ) දිස්ත්‍රික් ලේකම්වරුන්ගෙන්/ප්‍රාදේශීය ලේකම්වරුන්ගෙන් සමථ මණ්ඩල කොමිෂන් සභාව මෙයින් ඉල්ලා සිටී.

(අ) යම් සමථ මණ්ඩල ප්‍රදේශයක මූල මණ්ඩලයට පත් කිරීම සඳහා තමන්ගේ ම හැර අන් අයගේ නාම ඉදිරිපත් කිරීමට පහත සඳහන් පුද්ගලයින්ට හිමිකම් ඇත්තේ ය :

(i) එම සමථ මණ්ඩල ප්‍රදේශය පිහිටා ඇති පරිපාලන දිස්ත්‍රික්කය තුළ පිහිටි කාර්යාලයක නියුතු දෙපාර්තමේන්තු ප්‍රධානියෙකු හෝ ප්‍රාදේශීය දෙපාර්තමේන්තු ප්‍රධානියෙකු වන රාජ්‍ය නිලධාරියෙකුට හෝ පළාත් සභා රාජ්‍ය නිලධාරියෙකුට,

(ii) එම සමථ මණ්ඩල ප්‍රදේශය තුළ පිහිටි ආගමික පූජනීය ස්ථානයක හෝ පාසලක ප්‍රධානියෙකුට,

(iii) එම සමථ මණ්ඩල ප්‍රදේශය තුළ පදිංචිව සිටින විශ්‍රාම ලත් දෙපාර්තමේන්තු හෝ පාඨශාලා ප්‍රධානියෙකුට,

(iv) සමථ මූල මණ්ඩල සභාපතිවරයෙකුට.

(ආ) යම් සමථ මණ්ඩල ප්‍රදේශයක මූල මණ්ඩලයට පත් කිරීම සඳහා නාම යෝජනා ඉදිරිපත් කිරීමට පහත සඳහන් මණ්ඩලවලට සංවිධානවලට සහ ආයතනවලට හිමිකම් ඇත්තේය :

(i) යටත් පිරිසෙයින් අවුරුදු පහක් තිස්සේ පවතින්නා වූද, පහත සඳහන් අරමුණු එකක් හෝ වැඩි ගණනක් ඉටු කරන්නා වූ හෝ ඒ සම්බන්ධ මෙහෙයක් කරන්නා වූ යම් මණ්ඩලයකට, සංවිධානයකට හෝ ආයතනයකට-

(අ) සමාජයේ අධ්‍යාපනික, ආගමික, සදාචාරාත්මක හෝ ආධ්‍යාත්මික වර්ධනය වැඩි දියුණු කිරීම සඳහා,

(ආ) සමාජ සුභසාධනය වර්ධනය කිරීම හෝ දුගී බව තුරන් කිරීම සඳහා,

(ඇ) ග්‍රාමීය හෝ ප්‍රජා සංවර්ධනය වැඩි දියුණු කිරීම සඳහා,

(ඈ) සංස්කෘතික හෝ ක්‍රීඩා වැඩි දියුණු කිරීම සඳහා, සහ

(ඉ) සෞඛ්‍ය, ආහාර හා නිවාස වැනි ජනයාගේ මූලික අවශ්‍යතාවන් සැලැස්වීම සහ සපයාදීම අරමුණු කරගත් ව්‍යාපෘති, වැඩ සටහන් සහ කටයුතු වැඩි දියුණු කිරීම සඳහා.

(ඇ) යම් සමථ මණ්ඩල ප්‍රදේශයක මූල මණ්ඩලයට පත් කිරීම සඳහා නාම යෝජනා ඉදිරිපත් කිරීමට දිස්ත්‍රික් ලේකම්වරුන්ට/ප්‍රාදේශීය ලේකම්වරුන්ට හිමිකම් ඇත්තේය.

(i) එම සමථ මණ්ඩල ප්‍රදේශය පිහිටා තිබෙන පරිපාලන දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්වරුන්ට,

(ii) යම් සමථ මණ්ඩල ප්‍රදේශයකට, බල මණ්ඩලයට පත්වීමක් ලැබීමට හිමිකම් ඇත්තේ පහත සඳහන් තැනැත්තන්ට බැවින්, ඔවුන්ගේ නම් පමණක් පත්වීම් පිණිස යෝජනා කළයුතු වේ. එනම්-

(අ) එම සමථ මණ්ඩල ප්‍රදේශය තුළ පදිංචිව සිටින හෝ එම ප්‍රදේශය තුළ යම් වැඩක යෙදී සිටින තැනැත්තන්,

(ආ) අති විශේෂ අවස්ථාගත කරුණුවලදී කොමිෂන් සභාව තීරණය කරන්නේ නම් එම සමථ මණ්ඩල ප්‍රදේශයෙන් පිටත පදිංචිව සිටින හෝ එම ප්‍රදේශයෙන් පිටත යම් වැඩක යෙදී සිටින තැනැත්තෙක්, සහ,

(ඇ) එම සමථ මණ්ඩල ප්‍රදේශය පිහිටා ඇත්තේ යම් පරිපාලන දිස්ත්‍රික්කයක් ඇතුළත ද, ඒ පරිපාලන දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් විසින් නම් කරනු ලබන රාජ්‍ය නිලධාරියෙක් මේ ඡේදය යටතේ නාම යෝජනා කරනු ලැබූ නිලධාරියෙකුට එම පරිපාලන දිස්ත්‍රික්කය ඇතුළත තිබෙන සෑම සමථ මණ්ඩල ප්‍රදේශයක මූල මණ්ඩලයකට පත්වීමක් ලැබීමට සුදුසුකම් ඇත.

(ඈ) දැනට සමථකාරවරුන් වශයෙන් ක්‍රියා කරනු ලබන වසර තුන ඉක්මවා ඇති ධුරය හිස් කරනු ලැබීමට නියමිතව ඇති සමථ මූල මණ්ඩල සභාපති/ සමථකාරවරුන්.

3. (අ) ඉහත 2 වැනි ඡේදයේ සඳහන් වන පුද්ගලයින්, මණ්ඩල, සංවිධාන සහ ආයතනවලට 2(අ) සහ (ආ) ඡේදවල දක්වා ඇති රාජ්‍ය නිලධාරීන්ගේ නම් ඉදිරිපත් කිරීමට ඔවුන්ට හැකිවේ. කිසියම් පුද්ගලයෙකුට තමන්ගේ ම නම යෝජනා කර ගැනීමට නොහැක.

(ආ) ඉහත 2 (ඇ) ඡේදයේ සඳහන් කර ඇති දිස්ත්‍රික් ලේකම්වරුන්ට රාජ්‍ය නිලධාරීන්ගේ නම් ඉදිරිපත් කළ හැකි අතර, ඒ අයගෙන් පස් දෙනෙකුට නොවැඩි ගණනක් කොමිෂන් සභාව විසින් අදාළ සමථකාරවරුන්ගේ මූල මණ්ඩලයට පත් කළ හැකිය.

4. *නාම යෝජනා කිරීමේ ආකෘති පත්‍රය :*

(අ) පුද්ගලයින් විසින් නාම යෝජනා ඉදිරිපත් කළ යුත්තේ පහත දැක්වෙන "අ" ආකෘති පත්‍රයට අනුකූලව ය.

(ආ) මණ්ඩල, සංවිධාන සහ ආයතන විසින් නාම යෝජනා ඉදිරිපත් කළ යුත්තේ "ආ" ආකෘති පත්‍රයට අනුකූලවය.

(ඇ) දිස්ත්‍රික් ලේකම්වරුන්/ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් නාම යෝජනා ඉදිරිපත් කළ යුත්තේ "ඇ" ආකෘති පත්‍රයට අනුකූලව ය.

එක් එක් නාම යෝජනාව වෙනම ආකෘති පත්‍රයක ලියා ඉදිරිපත් කළයුතු අතර, මීළඟ ඡේදයේ දක්වා ඇති පරිදි නාම යෝජනා ඉදිරිපත් කරන අයගේ නිර්දේශය ද නොවරදවාම එහි ඇතුළත් කළ යුතුය.

5. නාම යෝජකගේ නිර්දේශය හේතු රහිත නිර්දේශයක් නොවිය යුතුය. සමථකාරවරුන්ගේ මූල මණ්ඩලයට පත් කිරීම සඳහා යෝජනා කරන තැනැත්තාගේ යෝග්‍යතාවය හෝ අයෝග්‍යතාවය පිළිබඳව සිය නිශ්චයට එළඹීමට කොමිෂන් සභාවට හැකි වන පරිදි නිශ්චිත කරුණු එම නිර්දේශයේ දැක්විය යුතුය. උදාහරණයක් වශයෙන් ඔහුගේ/ඇයගේ වර්තමාන හෝ කලින් රක්ෂාව, එම වෘත්තියේ සේවය කළ නැතහොත් යෙදී සිටි කාල පරිච්ඡේදය ඔහු/ඇය විසින් දරන ලද යම් විශ්වාස හෝ වගකීම් සහිත තනතුරක් හෝ ඔහු/ඇය විසින් යම් සමාජ සේවා, ආගමික පුණ්‍ය සංවිධානයක, සංගමයක, මණ්ඩලයක දරන ලද නිලය තිබේ නම් එය ද සඳහන් කළ යුතුය.

6. කිසියම් පුද්ගලයෙක් හෝ මණ්ඩලයක්, සංවිධානයක් හෝ ආයතනයක් එකම සමථ මණ්ඩල ප්‍රදේශයක් සම්බන්ධයෙන් නාම යෝජනා තුනකට වැඩි සංඛ්‍යාවක් ඉදිරිපත් කිරීමෙන් හැකි තරම් දුරට වැළකී සිටිය යුතුය. එහෙත් දැනට සිටින සමථ මූල මණ්ඩල සභාපතිවරුන්ට හා ප්‍රාදේශීය ලේකම්/දිස්ත්‍රික් ලේකම්ට මෙම සීමාව අදාළ නොවේ.

7. සියලුම නාම යෝජනා 2008 නොවැම්බර් මස 30 වැනි දිනට හෝ ඊට පෙර බත්තරමුල්ල, වීර ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, අංක 428/11, 02 වන මහලේ පිහිටි අධිකරණ අමාත්‍යාංශයේ සමථ මණ්ඩල කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන පරිදි එවිය යුතුය.

8. කොමිෂන් සභාව විසින් සිය මතය අනුව සමථකරණ දක්ෂතා සහ ක්‍රම පිළිබඳ ප්‍රාථමික පුහුණු පාඨමාලාවක් හැදෑරීමට යෝග්‍ය සුදුසුකම් ඇති තැනැත්තන් මුලින් තෝරා ගනු ඇත.

ඒ. කේ. ඩී. ඩී. ඩී. අරන්දර,
ලේකම් (වැඩ බලන),
සමථ මණ්ඩල කොමිෂන් සභාව.

2008 ඔක්තෝබර් මස 08 වැනි දින,
බත්තරමුල්ල,
වීර ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ,
අංක 428/11, 02 වන මහලේ,
අධිකරණ හා අධිකරණ ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ,
සමථ මණ්ඩල කොමිෂන් සභා කාර්යාලයේ දී ය.

**'අ' ආකෘති පත්‍රය**

***(නාම යෝජනා ඉදිරිපත් කිරීමට සුදුසු පුද්ගලයන් විසින් පිරවීම සඳහා)***

1. සමථ මණ්ඩල ප්‍රදේශය :———.
2. පරිපාලන දිස්ත්‍රික්කය :———.
3. නාම යෝජනාව ඉදිරිපත් කරන පුද්ගලයා පිළිබඳ විස්තර :———.
   (අ) ඔබගේ සම්පූර්ණ නම :———.
   (ආ) ඔබගේ පදිංචි ලිපිනය :———.
   (ඇ) ඔබ නාම යෝජනාව ඉදිරිපත් කරන්නේ කුමන තත්ත්වයෙන් ද යන බව :———.
   (i) ඔබ දෙපාර්තමේන්තු ප්‍රධානියෙක් ද ? එසේ නම් මේවා සඳහන් කරන්න :
   දෙපාර්තමේන්තුවේ නම :———.
   ඔබගේ කාර්යාලයේ පිහිටීම :———.
   ඔබ දරන තනතුර :———.
   (ii) ඔබ පූජනීය ස්ථානයක ප්‍රධානියෙක් ද? එසේ නැතහොත් ප්‍රාදේශීය දෙපාර්තමේන්තු ප්‍රධානියෙක් ද? නැතහොත් පාසලක ප්‍රධානියෙක් ද? එසේ නම් මේවා සඳහන් කරන්න:
   එහි නම :———.
   එහි පිහිටීම :———.
   ඔබ දරන ලද තනතුර :———.
   (iii) ඔබ විශ්‍රාම ලත් දෙපාර්තමේන්තු ප්‍රධානියෙක් ද? එසේ නැතහොත් විශ්‍රාම ලත් පාඨශාලා ප්‍රධානියෙක් ද? එසේ නම් මේවා සඳහන් කරන්න:
   එහි නම :———.
   ඔබ අන්තිම වරට දරන ලද තනතුර :———.
   ඔබ පදිංචිව සිටින සමථ මණ්ඩල ප්‍රදේශය :———.
4. ඔබ විසින් නාම යෝජනා කරනු ලබන තැනැත්තා පිළිබඳ විස්තර:
   (අ) ඔහුගේ සම්පූර්ණ නම :———.
   (ආ) ඔහු පදිංචි ලිපිනය :———.
   (ඇ) ඔහු පදිංචිව සිටින්නේ ඉහත සඳහන් කරනු ලැබූ සමථ මණ්ඩල ප්‍රදේශය තුළ ද? එසේ නැතහොත් එකී සමථ මණ්ඩල ප්‍රදේශයෙන් පිටත ද? :———.
   (ඈ) ඔහු එකී සමථ මණ්ඩල ප්‍රදේශය තුළ යම් වැඩක යෙදී සිටින්නේ ද? එම ප්‍රදේශයෙන් පිටත වැඩක යෙදී සිටින්නේ ද? :———.
   (ඉ) ඔබගේ නිර්දේශය ඊට හේතු ද සහිතව සඳහන් කරන්න. :—.

දිනය :———. ———,
අත්සන
(මුද්‍රාව තිබේ නම්)

**'ආ' ආකෘති පත්‍රය**

***(නාම යෝජනා කිරීමට සුදුසුකම් ඇති මණ්ඩලයේ, සංවිධානයේ හෝ ආයතනයේ ලේකම් විසින් පිරවිය යුතුය)***

1. සමථ මණ්ඩල ප්‍රදේශය :———.
2. පරිපාලන දිස්ත්‍රික්කය :———.
3. නාම යෝජනාව ඉදිරිපත් කරන මණ්ඩලය, සංවිධානය හෝ ආයතනය පිළිබඳ විස්තර :
   (අ) එහි නම :———.
   (ආ) එහි ලියාපදිංචි/රාජකාරි ලිපිනය :———.
   (ඇ) එය ලියාපදිංචි කරන ලද හෝ පිහිටුවන ලද දිනය :———.
   (ඈ) එය කොතරම් කාලයක සිට පැවතෙන්නේ ද යන බව :—.
   (ඉ) එයින් ඉටු කෙරෙන අරමුණ හෝ සිදුවන මෙහෙය :———.
4. නාම යෝජනා කරනු ලබන තැනැත්තා පිළිබඳ විස්තර:
   (අ) ඔහුගේ සම්පූර්ණ නම :———.
   (ආ) ඔහු පදිංචි ලිපිනය :———.
   (ඇ) ඔහු පදිංචිව සිටින්නේ ඉහත සඳහන් කරනු ලැබූ සමථ මණ්ඩල ප්‍රදේශය තුළ ද? එසේ නැතහොත් එකී සමථ මණ්ඩල ප්‍රදේශයෙන් පිටත ද? :———.
   (ඈ) ඔහු එකී සමථ මණ්ඩල ප්‍රදේශය තුළ යම් වැඩක යෙදී සිටින්නේ ද? එම ප්‍රදේශයෙන් පිටත වැඩක යෙදී සිටින්නේ ද? :———.
   (ඉ) ඔහු රාජ්‍ය නිලධරයෙකු ද? එසේ නම් ඔහු දරන තනතුර සඳහන් කරන්න :———.

5. අදාළ මණ්ඩලය, සංවිධානය හෝ ආයතනය ඔහුගේ නාම යෝජනාවට අවසර දෙමින් යෝජනාවක් සම්මත කර ඇද්ද? එසේ නම් එම යෝජනා සම්මතයේ දිනය සඳහන් කරන්න :———.

6. මණ්ඩලයේ, සංවිධානයේ හෝ ආයතනයේ නිර්දේශය ද ඊට හේතු ද සමඟ සඳහන් කරන්න :———.

දිනය :———. :———.

ලේකම්
(මණ්ඩලයේ, සංවිධානයේ හෝ ආයතනයේ මුද්‍රාව)

**'ඇ' ආකෘති පත්‍රය**
***(නාම යෝජනා ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති දිසාපති විසින් පිරවිය යුතුය)***

1. සමථ මණ්ඩල ප්‍රදේශ :———.
2. පරිපාලන දිස්ත්‍රික්කය :———.
3. නාම යෝජනාව ඉදිරිපත් කරන දිසාපති පිළිබඳ විස්තර :———.
   (අ) ඔබගේ සම්පූර්ණ නම :———.
   (ආ) ඔබගේ රාජකාරී ලිපිනය :———.
   (ඇ) ඔබ දිසාපතිව සිටින්නේ කුමන දිස්ත්‍රික්කයක ද? :———.
4. නාම යෝජනා කරනු ලබන නිලධාරියාගේ විස්තරː
   (අ) ඔහුගේ සම්පූර්ණ නම :———.
   (ආ) ඔහු රාජ්‍ය නිලධාරියෙක් ද? එසේ නම් ඔහු දරන තනතුර සඳහන් කරන්න :———.
   (ඇ) ඔහුගේ රාජකාරී ලිපිනය/පුද්ගලික ලිපිනය :———.
5. ඔබගේ නිර්දේශය සහ ඊට හේතු ද සහිතව සඳහන් කරන්න :———.

දිනය :———. :———.

අත්සන
(මුද්‍රාව තිබේ නම්)

10-762

**රජයේ වෛද්‍ය සැපයීම් අංශය**

තොග ගණන් ගැනීම හා වාර්ෂික හරි වැරදි බැලීම සඳහා රජයේ වෛද්‍ය සැපයීම් අංශයේ මධ්‍යම බෙහෙත් ගබඩාව වසා තැබීම

වර්ෂ 2008 දෙසැම්බර් මස 01 වැනි දින සිට 2008 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා, (දෙදිනම ඇතුළත්ව ) තොග ගණන් බැලීම සඳහා රජයේ වෛද්‍ය සැපයීම් අංශයේ ගබඩා වසා තබනු ඇත.

අත්‍යවශ්‍ය හදිසි ඖෂධ සහ අන්තරාදායක ඖෂධ හැර වෙනත් කිසිම ඖෂධයක් සඳහා එම කාල පරිච්ඡේදය තුළදී අයදුම්පත් භාර නොගන්නා බව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්, ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්, ශික්ෂණ රෝහල් අධ්‍යක්ෂවරුන්, මහ රෝහල් අධ්‍යක්ෂවරුන්, ගුවන්, නාවික, පාබල සහ පොලිසිය යන ආරක්ෂක අංශවල සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්, විශේෂිත ව්‍යාපෘති භාර ප්‍රධානීන් හා බෙහෙත් ශාලා භාර නිලධාරීන් වෙත මෙයින් කාරුණිකව දැනුම් දෙනු දෙමි.

වෛද්‍ය බී. වී. එස්. බෙනරගම,
වෛද්‍ය සැපයීම් අධ්‍යක්ෂ.

2008 ඔක්තෝබර් මස 24 වැනි දින,
වෛද්‍ය සැපයීම් අංශය,
අංක 357, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10,

10-767

**ඉඩම් සංවර්ධන ආඥාපනත (320 අධිකාරිය)**

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 6 (1) වගන්තිය යටතේ ගරු ඉඩම් හා ඉඩම් සංවර්ධන ඇමතිතුමා විසින් පුලිගු රාලලාගේ නිර්මලා පද්මිණී මහත්මිය, ඇයගේ රාජකාරිවලට අමතර වශයෙන් 2008.08.19 දින සිට කුරුණෑගල දිස්ත්‍රික්කයේ පොල්ගහවෙල කොට්ඨාසය සඳහා ඉඩම් නිලධාරියකු ලෙස පත් කර ඇත.

ජයලත් ර. වි. දිසානායක,
ලේකම්,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය.

2008 සැප්තැම්බර් මස 12 වැනි දින,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
අංක 80/5, ගොවිජන මන්දිරය, රජමල්වත්ත,
බත්තරමුල්ල.

10-737

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

**ලංකා බැංකුව-කැකිරාව ශාඛාව**

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 22 වන වගන්තිය යටතේ දැන්වීම

2008.09.12 වැනි දින පවත්වනලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. මහජන නොතාරිස් ඒ. සී. එස්. හමීඩ් මහතා විසින් සහතික කරනලද 2007.04.27 දිනැති අංක 1802 දරන බැඳුම්කරය මත මුල් මුදල හා 2008.08.07 දින තෙක් පොලිය වශයෙන් රුපියල් හතලිස් ලක්ෂ දොලොස් දහස් තුන්සිය තිස්අටයි ශත පනස් දෙකක (රු. 40,12,338.52) මුදලක් සමඟ රුපියල් තිස් හතර ලක්ෂ තිස්එක් දහස් දෙසිය දාහතක (රු. 34,31,217) මුදලක් මත වසරකට සියයට විසිඑකයි දශම තුනයි ශත (21.37%) බැගින් පොලියක්ද, 2008.08.08 වැනි දින සිට ගෙවීම නිම කරන දින තෙක් කැකිරාව, යකල්ල අංක 21 හි පදිංචි සංජය සුරංග

බණ්ඩාර සෙනෙවිරත්න මහතා සහ වතුපොල වලව්වේ සෙනෙවිරත්න මුදියන්සේලාගේ යමුනා කුමාරි සෙනෙවිරත්න මහත්මිය යන අයගෙන් එක්ව හා වෙන් වෙන්ව අයවිය යුතුව ඇත.

2. එකී අංක 1802 දරන බැදුම්කරය මත අයවියයුතු එකී රුපියල් හතළිස් ලක්ෂ දොලොස් දහස් තුන්සිය තිස් අටයි ශත පනස් දෙකක (රු. 40,12,338.52) මුදල සමඟ 2008.08.08 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහතකී ආකාරයට අයවියයුතු පොලිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගතහැකි ගාස්තු හා මුදල් ද අයකරගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කුලියාපිටිය පන්සල පාර, හි පදිංචි වෙන්දේසිකාර ජේ. ඇල්පියස් පෙරේරා මහතාට එකී ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වැනි වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥාපනතේ 21 වෙනි වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පල කිරීමට ලංකා බැංකුව, කැකිරාව ශාඛාවේ කළමනාකරුටද මෙයින් අවසරදී බලය පවරනු ලැබේ.

**දේපල පිළිබඳ විස්තරය**

උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, කැකිරාව ප්‍රාදේශීය ලේකම් ප්‍රදේශයේ, කලගම් කෝරලේ දකුණ, කුඩා කැකිරාව ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ, අංක 629 හි කුඩා කැකිරාව ග්‍රාමයේ යකල්ල පාරේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් සාදනලද අංක 908 දරන පිඹුරේ වෙන් කරන ලද 'ගොඩ' නැමැති ඉඩම් කැබැල්ල, උතුරට : ජල මණ්ඩලයේ ඉඩමද, නැගෙනහිරට : පටුමග ද, දකුණට : යකල්ල පාරට වෙන්කළ කොටස ද, බස්නාහිරට : ඉන්ද්‍රා කුමාරි අලුදෙණියගේ ඉඩම ද, මායිම්ව රූඩ් දෙකක (අ. 0, රූ. 2, පර්. 0) බිම් ප්‍රමාණය සමඟ එහි පිහිටි ගහකොළ වැවිලි ගොඩනැගිලි සහ සියලු දේ වේ. මෙය අනුරාධපුර දිසා ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එල්. ඩී. ඕ. 569/199 හි ලියාපදිංචි කර ඇත.

එකී ඉඩම බලයලත් මිනින්දෝරු ඩබ්. ඩී. දසනායක විසින් සාදන ලද 2006.08.26 දිනැති අංක 9822 දරන මැත මිණුම් පිඹුරේ පහත සඳහන් පරිදි විස්තර කර ඇත.

එකී කුඩා කැකිරාව ග්‍රාමයේ පිහිටි 'ගොඩ' ඉඩම නැමැති ඉඩම බලයලත් මිනින්දෝරු ඩබ්. ඩී. දසනායක විසින් සාදන ලද 2006.08.26 දිනැති අංක 9822 දරන පිඹුරේ විස්තර කළ ලොට් අංක 1 වශයෙන් සඳහන් ඉඩම් කැබැල්ල උතුරට : ජල මණ්ඩලයේ ඉඩම ද, නැගෙනහිරට : පාර (ප්‍රා. ස.), දකුණට : යකල්ල පාරට වෙන්කළ කොටස ද, බස්නාහිරට : ඉන්ද්‍රා කුමාරි අලුදෙණියගේ ඉඩම ද මායිම්ව රූඩ් දෙකක (0අ. 2රූ. 0පර්.) හෝ හෙක්ටයාර් බිංදුවයි දශම දෙකයි බිංදුවයි දෙකයි තුනක (හෙක්. 0.2023) ප්‍රමාණයෙන් යුත් ඉඩම සමඟ එහි පිහිටි ගහකොළ වැවිලි ගොඩනැගිලි සහ සියලු දේ වේ.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

ජී. පී. එල්. අමරසූරිය මහතා
කළමනාකරු.

ලංකා බැංකුව,
කැකිරාව.

10-832

**සෙලාන් බැංකුව පීඑල්සී-මීගමුව ශාඛාව**
**(2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත)**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2006 ජූනි මස 21 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගිණුම් අංකය : 0130-01678696-001.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිවි 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් අයි. ටී. ගුණතිලක විසින් සහතික කරන ලද 2006 ඔක්තෝබර් 26 දිනැති අංක 1409 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, කඳාන, ලියාපදිංචි සහතික ඩබ්ලිව් යූ 2723 යටතේ රෝහිත සර්විසස් යන නාමය විලාශය සහ අභිධානය යටතේ ස්වාමිත්වයේ ව්‍යාපාරයක් පවත්වා ගෙන යන මහමාලගේ ජ්ලැසිඩස් අරුල් රෝහිත පෙරේරා යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් අසූහයලක්ෂ හතලිස්නවදහස් පන්සිය විසිහතරයි ශත අසූඑකක (රු. 86,49,524.81) මුදලක්, 2007 දෙසැම්බර් මස 31 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින්ද එකී රු. 86,49,524.81 මුදල ද, 2008 ජනවාරි මස 1 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් තුනක් (33%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 1409 දරන බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ සහ ගම්පහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුල අළුත්කුරු කෝරලේ රාගම් පත්තුවේ ජාඇල නගර සභා සීමාව තුල කණුවන පිහිටි බලයලත් මිනින්දෝරු එම්. ඩී. එඩ්වඩ් විසින් සාදන ලද 2000.05.30 දිනැති අංක 2251ඒ දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන කහටගහවත්ත හෙවත් ගොරකගහවත්ත නමැති ඉඩමේ ලොට් 1 ලකුණු කල බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම් උතුරට : මෙම ඉඩමේ ඉතිරි කොටස ද; නැගෙනහිරට : ගාමිණී පාර ද ; දකුණට : ලොට් 2 සහ බස්නාහිරට : මියගිය මෙරිල් ෆොන්සේකාගේ ඉඩම යන මායිම් තුල පර්චස් දොලහයි දශම හතක් ( අ. 0, රූ. 0, පර්. 12.7 ) විශාල, ගොඩනැගිලි ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රඉරුව එච්. 48/258 හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එම්. කේ. ප්‍රේමතිලක,
සහකාර සාමාන්‍යාධිකාරී - නීති.

10-852/1

---

## මහජන බැංකුව - කතරගම ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29අ වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.09.30 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් දැනුම් දෙනු ලැබේ

මාතර ප්‍රසිද්ධ නොතාරිස් එම්. සී. රණසිංහ මහත්මිය විසින් සහතික කරන ලද 1995 අප්‍රේල් මස 26 වැනි දිනැති අංක 2168 දරන උකස්කරය සහ, බදුල්ල ප්‍රසිද්ධ නොතාරිස් ජේ. ඒ. එස්. දයාරත්න මහතා විසින් සහතික කරන ලද 2002.02.27 වැනි දින අංක 5670 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, ජගත් චන්ද්‍රකීර්ති ජයසිංහ සහ ගුණමුනි ක්‍රිෂාණි රේණුකා ද සිල්වා ජයසිංහ යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරයන් යටතේ රුපියල් හැත්තෑ හයලක්ෂ අනූඑක්දහස් එකසිය විසි පහක (රු. 76,91,125) මුදලක් සහ රුපියල් හයලක්ෂ අසූහතර දහස් දෙසිය තිස් අටයි ශත දොළහක (රු. 6,84,238.12) මුදලක් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින් ද, 2003.12.30 වැනි දින සිට රුපියල් හාරලක්ෂ අනූඑක්දහස් එකසිය විසි පහක (රු. 4,91,125) මුදල සඳහා වර්ෂයකට (12%) බැගින් පොළිය ද, රුපියල් පනස්හත් ලක්ෂයක (රු. 57,00,000) මුදල සඳහා 1999.02.08 දින සිට වර්ෂයකට (26%) පොළිය ද, රුපියල් පහලොස් ලක්ෂයක (රු. 15,00,000) මුදල සඳහා 1998.05.29 දින සිට වර්ෂයකට (26%) පොළිය ද, රුපියල් හයලක්ෂ අසූහතර දහස් දෙසිය තිස් හතයි ශත දොළහක (රු. 6,84,237.12) මුදල සඳහා 2008.07.23 දින සිට වර්ෂයකට (26%) බැගින් පොළිය ද, අයවිය යුතු ඇති බැවින් ද, වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා විකිණීමේ ගාස්තු එකී මහජන බැංකු පනතේ 29 ඔ වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් ද, ඒදින තෙක් කරනු ලැබූ ඇති ගෙවීම් (කිසිවක් වේ නම්) අඩු කිරීමෙන් පසු අයකර ගැනීම සඳහා 2168 දරන සහ අංක 5670 දරන උකස් බැඳුම්කර මගින් එකී බැංකුවට උකස්කර ඇති දේපළ සහ පරිශ්‍රය බදුල්ල බලයලත් වෙන්දේසිකාර ඩබ්. ජයතිලක මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

#### උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තරය

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, බුත්තල කෝරළේ, දෙටගමුව නමැති ගමෙහි පිහිටි මිණුම්පතිගේ අ. ග. පි. 25 හි බිම් කට්ටි 163 හි කොටසක් වන අවසරලත් මිනින්දෝරු ජී. ඩබ්. ජී. ඩී. වී. කරුණාරත්න මහතා විසින් 1994.09.14 දින මැන සකස් කරන ලද අංක 1143 දරන කැබලි අංක 01 ලෙස නිරූපණය කර ලද "දෙටගමුවයාය" නමැති, උතුරට : අ. ග . පි. 25 හි කැබලි අංක 158 ද, නැගෙනහිරට : අ. ග. පි. 25 හි කැබලි අංක 160 (ගඟ රක්ෂිතය) ද, දකුණට : මෙම ඉඩමේ කොටසක් ද, බස්නාහිරට : අ. ග. පි. 25හි කැබලි අංක 296 (මාර්ග රක්ෂිතය) ද යන මායිම් තුළ අක්කර එකක (අ. 1, රූ. 0, පර්. 0) හෙවත් හෙක්ටයාර් බිංදුවයි දශම හතරයි බින්දුවයි හතර (හෙක්. 0.404) ක් විශාලත්වයෙන් යුත් ඉඩම හා එහි තුළ පිහිටි, ගහකොළ, පළතුරු සහ ගොඩනැගිලි ආදී සියලු දේත් වේ. මෙය දැනට මොණරාගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එල්. ඩී. ඕ. 1/363 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකරු.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
මොණරාගල.

10-841

---

## ඩීඑෆ්සීසී බැංකුව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය ප්‍රකාර (ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුනු ) ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ(විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### අධ්‍යක්ෂ මණ්ඩලය යෝජනා සම්මතය

ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු ඩීඑෆ්සීසී බැංකුව නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. එම්. ගුණරත්න විසින් ලියා සහතික කරන ලද අංක 1455 හා 2004.07.22 දින ද අංක 1596 හා 2005.05.04 දින ද දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රිකා සමාජවාදී ජනරජයේ යථා පරිදි සංස්ථාගත කර ඇත්තා වූ ද ලියාපදිංචි කාර්යාලය කොළඹ 3 හි පිහිටා ඇත්තා වූ ද සමාගමක් වන (මෙහි මින් ඉදිරියට 'සමාගම' යනුවෙන් සඳහන් කරන) ප්‍රොෆ් කම්පියුටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම විසින් පැහැර හැර ඇති හෙයින් ද 2008 ජූනි මස 30 වැනි දින ඉහත කී අංක 1455 හා 1596 දරන උකස් බැඳුම්කරය මත එකී ප්‍රොෆ් කම්පියුටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් තිස්තුන් ලක්ෂ අනූහතර දහස් හතලිස් නවයකුත් ශත විසි අටක (රු. 33,94,049.28) මුදලක් සහ 2008 ජූලි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් දහඅට ලක්ෂයක් (රු. 18,00,000) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන් මසකට වරක් ප්‍රතිශෝධනය කර ශ්‍රී ලංකා මහ බැංකු විසින් සතිපතා පදනම මත පළකරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ. ඩබ්ලිව්. පී. ආර්) වර්ෂයකට සියයට හයකුත් දශම පහක් (6.5%) ඉහළ අනුපාතිකයක් මත ගණන්

බලනු ලබන ආසන්නතම ඉහල 0.5%ට තීන්දු කරන අනුපාතිකයක් වන වර්ෂයකට සියයට 19%ක් නොඉක්මවිය යුතු හා සියයට 11%ට අඩු නොවිය යුතු අනුපාතිකයක් මත පොලිය සහ රුපියල් දසලක්ෂ පනස් හතර දහස් හාරසිය දහනවයකුත් ශත හතලිස් අටක් (රු. 10,54,419.48) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන් මසකට වරක් ප්‍රතිශෝධනය කර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සතිපතා පදනම මත පළකරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ. ඩබ්ලිව්. පී. ආර්.) වර්ෂයකට සියයට හතක් (7%) ඉහල අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහල 0.5% තීන්දු කරන අනුපාතිකය මත පොලිය ද, ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් තිස්තුන් ලක්ෂ අනූහතර දහස් හතලිස් නවයකුත් ශත විසිඅටක (රු. 33,94,049.28) මුදලක් සහ 2008 ජූලි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් දහඅට ලක්ෂයක් (රු. 18,00,000) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන් මසකට වරක් ප්‍රතිශෝධනය කර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සතිපතා පදනම මත පළකරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ. ඩබ්. පී. ආර්.) වර්ෂයකට සියයට හයකුත් දශම පහක් (6.5%) ඉහල අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහල 0.5%ට තීන්දු කරන අනුපාතිකයක් වන වර්ෂයකට සියයට 19%ක් නොඉක්මවිය යුතු හා සියයට 11%ට අඩු නොවිය යුතු අනුපාතිකයක් මත පොලිය සහ රුපියල් දසලක්ෂ පනස් හතර දහස් හාරසිය දහනවයකුත් ශත හතලිස් අටක් (රු. 10,54,419.48) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන් මසකට වරක් ප්‍රතිශෝධනය කර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සතිපතා පදනම මත පළකරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ. ඩබ්. පී. ආර්.) වර්ෂයකට සියයට හතක් (7%) ඉහල අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහල 0.5%ට තීන්දු කරන අනුපාතිකය මත පොලිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය ඊට අයත් පොදු අංග හිමිකම සමග විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය අනුව හා එකී උකස් බැඳුම්කරවල ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 1455 සහ 1596 දරන උකස් බැඳුම්කර මගින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම සහ පරිශ්‍රය ඊට අයත් පොදු අංග (Common elements) හිමිකම් සමග කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

**අංක 1455 හා 1596 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කොළඹ මහනගර සභා පරිපාලන සීමාව ඇතුළත වෝඩ් අංක 38, බම්බලපිටිය, සාන්ත අන්තෝනි මාවත (කලින් කොල්ලුපිටිය පටුමග) වරිපනම් අංක 70 (කොටසක්) දරන, (බලයලත් මිනින්දෝරු පී. සින්නතම්බි විසින් මැන සාදන ලද අංක 3106 හා 1991 අප්‍රේල් මස 2 වැනි දින දරන පිඹුරේ දැක්වෙන ලොට් XIB දරන බිම් කට්ටිය නැවත මැනීමක් වන ලොට් XIB ලෙස ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටියට මායිම්, උතුරට : සාන්ත අන්තෝනි මාවත (කලින් කොල්ලුපිටිය පටුමග) ද, නැගෙනහිරට : බලයලත් මිනින්දෝරු පී. සින්නතම්බි විසින් මැන සාදන ලද අංක 2448ඒ හා 1989 ජූනි 20 වැනි දින දරන සභාධිපත්‍ය පිඹුරේ ලොට් X ද, දකුණට : ආර්. ඒ. ද මැල් මාවත වරිපනම් අංක 400/1 සිට 6 දක්වා පරිශ්‍ර ද, බස්නාහිරට : ඉහත සඳහන් අංක 3106 දරන පිඹුරේ ලොට් XIA ද යන මායිම් ඇතුළත, බලයලත් මිනින්දෝරු පී. සින්නතම්බි විසින් මැන සාදන ලද අංක 3695 හා 1992 සැප්තැම්බර් මස 18 වැනි දින දරන සභාධිපත්‍ය පිඹුර ප්‍රකාර රූඩ් එකකුත් පර්චස් දහයයි දශම හයයි නවයක් (අ. 0, රූ. 1, පර්. 10.69) නැතහොත් හෙක්ටයාර් 0.1282ක බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම එහි පිහිටි මහල් ගොඩනැගිල්ල ද වේ.

1. අංක ජී 34 දරන කාමර ඒකකය (සාප්පුව) බලයලත් මිනින්දෝරු පී. සින්නතම්බි විසින් මැන සාදන ලද අංක 3695 හා 1992 සැප්තැම්බර් මස 18 වැනි දින දරන සභාධිපත්‍ය පිඹුරේ දැක්වෙන සාන්ත අන්තෝනි මාවත වරිපනම් අංක 70 (කොටසක්) දරන බිම් මහලේ ජී 34 සාප්පු ලෙස ලකුණු කළ ඒකකයට මායිම්, උතුරට : මෙම ඒකකය සහ සීඊ 24 අතර බිත්තියේ මධ්‍යය ද, නැගෙනහිරට : මෙම ඒකකය සහ ජී 35 ඒකකය අතර බිත්තියේ මධ්‍යම ද, දකුණට : මෙම ඒකකය සහ සීඊ 20හි විවෘත අවකාශය ද, බස්නාහිරට : මෙම ඒකකය සහ ජී 33 ඒකකය අතර බිත්තියේ මධ්‍යය ද, පතුල සීඊ 20ට ඉහලින් වූ මෙම ඒකකයේ කොන්ක්‍රීට් බිමෙහි මධ්‍යය සහ මුදුනත මෙම ඒකකයට ඉහලින් ඇත් එෆ් 37 ඒකකයේ කොන්ක්‍රීට් බිමෙහි මධ්‍යය ද යන මායිම් ඇතුළත වර්ග මීටර 26.3ක් එනම්, වර්ග අඩි 283ක් බිම් ප්‍රමාණයෙන් යුත් සාප්පු ඒකකය.

ජී 34 ඒකකය සාප්පුවකි.
ජී 34 ඒකකය සඳහා ආසන්නතම පොදු ප්‍රවේශ ඉඩකඩ සීඊ 24ය.

2. අංක ජී. 35 දරන කාමර ඒකකය (සාප්පුව), බලයලත් මිනින්දෝරු පී. සින්නතම්බි විසින් මැන සාදන ලද අංක 3695 හා 1992 සැප්තැම්බර් මස 18 වැනි දින දරන සභාධිපත්‍ය පිඹුරේ දැක්වෙන සාන්ත අන්තෝනි මාවත වරිපනම් අංක 70 (කොටසක්) දරන බිම් මහලේ ජී 35 ලෙස ලකුණු කළ සාප්පු ඒකකයට මායිම්, උතුරට : මෙම ඒකකය සහ සීඊ 24 අතර බිත්තියේ මධ්‍යය ද, නැගෙනහිරට : මෙම ඒකකය සහ ජී 36 ඒකකය අතර බිත්තියේ මධ්‍යය ද, දකුණට : මෙම ඒකකය සහ සීඊ 20හි විවෘත අවකාශය ද, බස්නාහිරට : මෙම ඒකකය සහ ජී 34 ඒකකය අතර බිත්තියේ මධ්‍යය ද, පතුල සීඊ 20ට ඉහලින් වූ මෙම ඒකකයේ කොන්ක්‍රීට් බිමෙහි මධ්‍යය සහ මුදුනත මෙම ඒකකයට ඉහලින් ඇති එෆ් 38 ඒකකයේ කොන්ක්‍රීට් බිමෙහි මධ්‍යය ද, යන මායිම් ඇතුළත වර්ග මීටර් 26.3ක්, එනම් වර්ග අඩි 283ක් බිම් ප්‍රමාණයෙන් යුත් සාප්පු ඒකකය.

ජී 35 ඒකකය සාප්පුවකි.
ජී 35 ඒකකය සඳහා ආසන්නතම පොදු ප්‍රවේශ ඉඩකඩ සීඊ 24 ය.

3. අංක ජී 33 දරන කාමර ඒකකය (සාප්පුව) බලයලත් මිනින්දෝරු පී. සින්නතම්බි විසින් මැන සාදන ලද අංක 3695 හා 1992 සැප්තැම්බර් මස 18 වැනි දින දරන සභාධිපති පිඹුරේ දැක්වෙන සාන්ත අන්තෝනි මාවත වරිපනම් අංක 70 (කොටසක්) දරන බිම් මහලේ ජී 33 ලෙස ලකුණු කළ සාප්පු ඒකකයට මායිම්, උතුරට : මෙම ඒකකය සහ සීඊ 24 අතර බිත්තියේ මධ්‍යය ද, නැගෙනහිරට : මෙම ඒකකයේ සහ ජී 34 ඒකකය අතර බිත්තියේ මධ්‍යය ද, දකුණට : මෙම ඒකකය සහ සීඊ 20හි විවෘත අවකාශය ද, බස්නාහිරට : මෙම ඒකකය සහ ජී 31ඒ ඒකකය අතර බිත්තියේ මධ්‍යය සහ සීඊ 24 ද, පතුල සීඊ 20ට ඉහලින් වූ මෙම ඒකකයේ කොන්ක්‍රීට් බිමෙහි මධ්‍යය ද, මුදුනත මෙම ඒකකයට ඉහලින් ඇති එෆ් 36 ඒකකයේ සහ සීඊ 25හි කොන්ක්‍රීට් බිමේ මධ්‍යය ද යන මායිම් ඇතුළත වර්ග මීටර් 35.1ක් එනම්, වර්ග අඩි 278ක් බිම් ප්‍රමාණයෙන් යුත් සාප්පු ඒකකය.

ජී 33 ඒකකය සාප්පුවකි.
ජී 33 ඒකකය සඳහා ආසන්නතම පොදු ප්‍රවේශ ඉඩකට සීඊ 24ය.

මෙයට ඉහත සඳහන් අංක 3695 දරන සහාධිපත්‍ය පිඹුරේ රේඛනය කර විස්තර කර තිබෙන පොදු අංග හිමිකම ද ඇතුළත් ය.

ඒ. එන්. ෆොන්සේකා,
අධ්‍යක්ෂ/සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලු පාර,
කොළඹ 3.

10-853/4

---

## මහජන බැංකුව - දික්වැල්ල ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.08.29 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ :

"මාතර ප්‍රසිද්ධ නොතාරිස් ටී. එන්. රුබසිංහ විසින් සහතික කරන ලද 2007.05.17 දිනැති අංක 4188 සහ 2005.02.07 දිනැති අංක 2090 දරන උකස්කර ප්‍රකාර ගෙවීම් ලොකු කවඩි හැන්නදිගේ සුජිත් අනුර සහ ලොකු කවඩි හැන්නදිගේ පත්මසිරි යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කර අංක 4188 සහ 2090 යටතේ රුපියල් දොළොස් ලක්ෂ හතලිස් හතරදහස් නවසිය හැත්තෑපහයි ශත හැට තුනක මුදලක් (රු. 12,44,975.63) සහ රුපියල් තුන් ලක්ෂ තිස් දෙදහසක මුදලක් (රු. 3,32,000) සහ රුපියල් අටලක්ෂ හතලිස් හත්දහස් දෙසිය හතලිස් දෙකයි ශත අනූහයක මුදලක් (රු. 8,47,242.96) මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින් ද, 2008.02.14 දින සිට වර්ෂයකට සියයට විසි දෙක (22%) බැගින් රුපියල් දොළොස් ලක්ෂ හතලිස් හතර දහස් නවසිය හැත්තෑපහයි ශත හැටතුනක මුදල (රු. 12,44,975.63) සඳහා සහ 2008.06.20 දින සිට වර්ෂයකට සියයට දහනවයයි දශම දෙකයි පහ (19.25%) බැගින් රුපියල් තුන්ලක්ෂ තිස් දෙදහසක මුදල (රු. 3,32,000) සඳහා සහ 2008.06.20 වැනි දින සිට වර්ෂයකට සියයට විසිදෙක (22%) බැගින් රුපියල් අටලක්ෂ හතලිස් හත් දහස් දෙසිය හතලිස් දෙකයි ශත අනූහයක මුදල (රු. 8,47,242.96) සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය සහ අදාල මහජන බැංකු පනතේ 29එල් වගන්තිය යටතේ අයකර ගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව රුපියල් දොළොස් ලක්ෂ හතලිස් හතරදහස් නවසිය හැත්තෑපහයි ශත හැටතුනක මුදලක් (රු. 12,44,975.63) සහ රුපියල් තුන්ලක්ෂ තිස් දෙදහසක මුදලක් (රු. 3,32,000) සහ රුපියල් අටලක්ෂ හතලිස් හත්දහස් දෙසිය හතලිස් දෙකයි ශත අනූහයක මුදල (රු. 8,47,242.96) අයකර ගැනීම සඳහා මාතර බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද මහතා විසින් එකී අංක 4188 සහ 2090 දරන උකස්කර යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### දේපළ පිළිබඳ විස්තර

01. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුවේ, දොඩම්පහල පිහිටි පිස්සගෙවත්ත නමැති ඉඩමේ ලොට් අංක ඒ බෙදා වෙන්කළ ලොට් 01 බෙදා වෙන්කළ එච්. ඒ. ප්‍රේමරත්න බලයලත් මිනින්දෝරු මහතාගේ අංක 3693 සහ 1993.02.11 දිනැති දරන ප්ලෑන ප්‍රකාර ලොට් අංක 01 දරන බිම් කොටසට මායිම්, උතුරට : මෙම ඉඩමේම ලොට් අංක 02 කොටස ද. නැගෙනහිරට : මෙම ඉඩමේම ලොට් බී කොටස ද, දකුණට : මාතර තංගල්ල ප්‍රධාන මාර්ගය ද, බටහිරට : අශෝකාරාම පාර ද මායිම් වන පර්චස් තිස්පහක් (අ. 0, රූ. 0, පර්. 35) විශාල ඉඩම සහ ඒ තුල පිහිටි වැව්ලි, ගොඩනැගිලි යනාදී සියළු දැයද වේ.

මෙම ඉඩම මාතර දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 500/243හි ලේඛනගතව ඇත.

02. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුවේ, දොඩම්පහළ පිහිටි පිස්සගෙවත්ත නමැති ඉඩමේ ලොට් අංක ඒ බෙදා වෙන් කල ලොට් 02 බෙදා වෙන්කළ එච්. ඒ. ප්‍රේමරත්න බලයලත් මිනින්දෝරු මහතාගේ අංක 3693 සහ 1993.02.11 දිනැති දරන ප්ලෑන ප්‍රකාර ලොට් අංක 02 දරන බිම් කොටසට මායිම්, උතුරට : අන්දිරිස් පදිංචිව සිටිය වත්ත ද, නැගෙනහිරට : මෙම ඉඩමේම ලොට් අංක බී දරන කොටස ද, දකුණට : මෙම ඉඩමේම ලොට් අංක 01 දරන කොටස ද, බස්නාහිරට : අශෝකාරාම පාර ද, මායිම් වන පර්චස් පහක් (අ. 0, රූ. 0, පර්. 5) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි වැව්ලි, ගොඩනැගිලි යනාදී සියළු දෙය ද වේ.

මෙම ඉඩම මාතර දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 500/244හි ලේඛනගතව ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
මාතර.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 38/1ඒ, පිට්ටනිය පාර,
මාතර.

10-840

---

## මහජන බැංකුව - වැලිමඩ ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනා සම්මතය

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.08.05 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ :

"මහජන බැංකුව වෙනුවෙන් බදුල්ල ප්‍රසිද්ධ නොතාරිස් පී. පී. නානායක්කාර යන අය විසින් සහතික කරන ලද අංක 4436 සහ

2006.07.19 වැනි දින දරන උකස් බැඳුම්කරය සහ මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් ඒ. කේ. විජේරත්න යන අය විසින් සහතික කරන ලද අංක 4234 සහ 2004.05.10 වැනි දින දරන උකස් බැඳුම්කරය යන බැඳුම්කර මත අයවිය යුතු ගෙවීම් කිරීම මුල්ලේ විදානේලාගේ දොන් අතුල හේමචන්ද්‍ර සහ කුමුදුනි සකුන්තලා ද අල්විස් යන අය විසින් පැහැර හැර ඇති බැවින් එකී බැඳුම්කර අංක 4436 මත දැනට රුපියල් දෙලක්ෂ හැත්තෑ දෙදහස් පන්සිය හැත්තෑ තුනයි ශත අනූ දෙකක (රු. 2,72,573.92) මුදලක් සහ එකී අංක 4234 දරන බැඳුම්කරය මත දැනට රුපියල් හාර ලක්ෂ අනූදහස් එකසිය හැත්තෑ නවයයි ශත අනූවක (රු. 4,90,179.90) මුදලක් මහජන බැංකුවට අයවිය යුතුව හා ලැබිය යුතුව ඇත. එබැවින් රුපියල් දෙලක්ෂ හැත්තෑ දෙදහස් පන්සිය හැත්තෑ තුනයි ශත අනූ දෙකක (රු. 2,72,573.92) මුදල ද ඒ සමග එකී මුදල වූ දෙලක්ෂ හැත්තෑ දෙදහස් පන්සිය හැත්තෑ තුනයි ශත අනූ දෙකක (රු. 2,72,573.92) එකී මුදල මත 2008.02.02 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් වර්ෂයකට සියයට දහ අටයි දශම පහක් (18.5%) බැගින් තවදුරටත් වූ පොලිය ද, රුපියල් හාරලක්ෂ අනූ දහස් එකසිය හැත්තෑ නවයයි ශත අනූවක (රු. 4,90,179.90) එකී මුදල ද ඒ සමග රුපියල් හාරලක්ෂ අනූදහස් එකසිය හැත්තෑ නවයයි ශත අනූවක (රු. 4,90,179.90) එකී මුදල මත 2008.02.10 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් වර්ෂයකට සියයට විසිහතරක් (24%) බැගින් තවදුරටත් වූ පොලිය ද, එකී මහජන බැංකු පනතේ 29එල් වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් හා ගාස්තු ද එදින තෙක් කරනු ලැබ ඇති ගෙවීම් (කිසිවක් වේ නම්) අඩු කිරීමෙන් පසු අදාල මුදල අයකර ගැනීම සඳහා බදුල්ල බලයලත් වෙන්දේසිකාර ඩබ්. ජයතිලක යන අය විසින් එකී අංක 4436 හා 4234 දරන උකස් බැඳුම්කර මගින් එකී බැංකුවට උකස්කර ඇති දේපළ සහ පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි, 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.".

### දේපළ පිළිබඳ විස්තර

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර මහ නගර සභා සීමාව තුළ යටිනුවර ගඟ වට කෝරලයේ නිට්ටාවල හි පිහිටා ඇති මාවිල්මඩ පාරේ වරිපනම් අංක 16/18 යටතේ බෙදා වෙන් කොට සීමා නිර්ණය කර ඇති මෙම ඉඩම් කොටස සහ පරිශ්‍රය මහනුවර බලයලත් මිනින්දෝරු පී. එච්. ටී. සිල්වා යන අය විසින් මැන සාදන ලද 1992.06.27 දිනැති අංක 484 දරන පිඹුරේ කැබලි අංක 1 යනුවෙන් සළකුණු කර ඇති (මෙය බලයලත් මිනින්දෝරු ටී. පී. මුරේ යන අය මැන සාදන ලද 1961.12.22 දිනැති අංක 1455/61 පිඹුරේ කැබලි අංක 19බී යනුවෙන් බෙදා වෙන් කොට ඇති ඉඩම් කැබැල්ල වේ) එකී ඉඩම් කැබලි 1හි මායිම් උතුරට : මහ නගර සභා පාර, නැගෙනහිරට : පෙර කී 1455/61 පිඹුරේ කැබලි අංක 18, දකුණට : එකී අංක 484 පිඹුරේ කැබලි අංක 2, බස්නාහිරට : එකී අංක 484 පිඹුරේ කැබලි අංක 3 (අඩි 10යේ ප්‍රවේශ මාර්ගය) යන මායිම් තුළ පිහිටි පර්චස් දහයයි දශම පහයි බින්දුවක් (අ. 0, රූ. 0, පර්. 10.50) හෙවත් හෙක්ටයාර් 0.02625 වපසරියෙන් යුතු ඉඩම සහ ඒ තුළ අඩංගු සෑම සියලු දේ සමඟ වේ. මෙය මහනුවර දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A311/67 යටතේ ලියාපදිංචි කර ඇත.

පෙර කී නිට්ටාවල පිහිටි එකී අංක 484 පිඹුරේ කැබලි අංක 3 (අඩි 10යේ ප්‍රවේශ මාර්ගය) යනුවෙන් සලකුණු කොට ඇති මාවිල්මඩ පාරේ අංක 16/18 වරිපනම් අංකය දරන එකී බෙදා වෙන්කොට සීමා නිර්ණය කර ඇති අංක 3 දරන මෙම ඉඩම් කැබැල්ලේ සහ පරිශ්‍රයේ මායිම් උතුරට : මහ නගර සභා පාර, නැගෙනහිරට : අංක 484 පිඹුරේ කැබලි අංක 1, දකුණට : එකී අංක 484 පිඹුරේ කැබලි අංක 2, බස්නාහිරට : පාර සහ එකී අංක 1455/61 පිඹුරේ කැබලි අංක 19Aහි කොටසක් යන මායිම් තුළ පිහිටි පර්චස් දෙකයි දශම පහයි බින්දුවක් (අ. 0, රූ. 0, පර්. 2.50) හෙවත් හෙක්ටයාර් 0.00625 වපසරියෙන් යුතු ඉඩම වේ. මෙය මහනුවර දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක A311/68 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකාර,
බදුල්ල.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 24, ආර්. එච්. ගුණවර්ධන මාවත,
බදුල්ල.

10-838

---

### මහජන බැංකුව - හපුතලේ ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනා සම්මතය

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.06.27 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ :

"මහජන බැංකුව වෙනුවෙන් බදුල්ල ප්‍රසිද්ධ නොතාරිස් පී. පී. නානායක්කාර යන අය විසින් සහතික කරන ලද අංක 4106 සහ 2006.04.21 වැනි දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු ගෙවීම් කිරීම ආරුමුගම් පුෂ්පරාජ් සහ අරුමුගම් සිවඥාණම් යන අය විසින් පැහැර හැර ඇති බැවින් එකී අංක 4106 දරන බැඳුම්කරය මත රුපියල් දහනව ලක්ෂ දහදහස් තුන්සිය හැටහතයි ශත අටක (රු. 19,10,367.08) මුදලක් මහජන බැංකුවට දැනට අයවිය යුතුව හා ලැබිය යුතුව ඇත. එබැවින් රුපියල් දහනව ලක්ෂ දහදහස් තුන්සිය හැටහතයි ශත අටක් (රු. 19,10,367.08) වූ එකී මුදල ද ඒ සමග රුපියල් දාහත් ලක්ෂ අනූතුන්දහස් එකසිය පනස් නවයයි ශත තිස් එකක් (රු. 17,93,159.31) මත 2007.09.29 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් වර්ෂයකට සියයට විසි හතක් (27%) බැගින් තවදුරටත් වූ පොලිය ද එකී මහජන බැංකු පනතේ 29L වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් හා ගාස්තු ද එදින තෙක් කරනු ලැබ ඇති ගෙවීම් (කිසිවක් වේ නම්) අඩු කිරීමෙන් පසු අදාල මුදල අයකර ගැනීම සඳහා බදුල්ල බලයලත් වෙන්දේසිකාර ඩබ්. ජයතිලක යන අය විසින් එකී අංක 4106 දරන උකස් බැඳුම්කර මගින් එකී බැංකුවට උකස් කර ඇති දේපළ සහ පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.".

### දේපළ පිළිබඳ විස්තරය

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, මහපාත කෝරළයේ, මැදිකිඳ හපුතලේ නගර සභා සීමාව තුළ පිහිටි "කඩේ වත්ත කඩේ" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමට අවසරලත් මිනින්දෝරු එච්. ඩබ්. වෝල්ටර් මුණසිංහ යන අය සකස් කළ 1979.06.24 දිනැති අංක 1287 දරන පිඹුර ප්‍රකාර මෙම ඉඩම් කොටසේ මායිම් උතුරට : වරිපනම් අංක 26 දරන දේපළ, නැගෙනහිරට : පාර, දකුණට : පොදු පාර, බස්නාහිරට : පොදු පාර යන මායිම් තුළ පිහිටි පර්චස් එකයි දශම හයයි පහක් (අ. 0, රූ. 0,

දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ වැල්ලබොඩ පත්තුවේ බලපිටිය ප්‍රාදේශීය සභා සීමාව තුල වෙලගෙදර පිහිටි බලයලත් මිනින්දෝරු විතගොඩගේ විසින් සාදන ලද 1993 සැප්තැම්බර් 15 දිනැති අංක 211 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ඉත්තක්කරබොඩරල්ල සහ රණකෝම්බු අවිය වගා කල වත්ත, කිරියගේවත්ත, කොඩලකිරියගේ වෙල සහ දෙල්ගහකොරටුවේ වත්තල යනාදී අවිය පදිංචිව සිටි, නමැති ගොඩනැගිලි, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සහිත ඉඩමේ ලොට් ඒ ලකුණු කල බෙදා වෙන් කළ ඉඩම් කොටසට මායිම්, උතුරට : පාර සහ ජන්ම පදිංචිකරුවන් විසින් හිමිකම් කියනු ලබන ඉඩම ද, නැගෙනහිරට : ජන්ම පදිංචිකරුවන් විසින් හිමිකම් කියනු ලබන ඉඩම, දකුණට : මාදු ගඟ ද සහ බස්නාහිරට : ජන්ම පදිංචිකරුවන් විසින් හිමිකම්

කියනු ලබන ඉඩම, යන මායිම් තුල එකී අංක 211 දරන සැලැස්ම අනුව අක්කර හයයි රූඩ් එකයි පර්චස් පහලොවක් (අ. 6, රූ. 1, පර්. 15) විශාල ඉඩම. මෙය බලපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 227/210 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එම්. කේ. ප්‍රේමතිලක,
සහකාර සාමාන්‍යාධිකාරි - නීති.

10-678/3

---

### කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මතය

ගිණුම් අංක : 1080053501 සහ 1080010231.

2008 ජූලි මස 10 වන දින පැවැත් වූ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත සඳහන් පරිදි විශේෂිතව හා ඒකමතිකව සම්මත කර ගන්නා ලදී.

මාතලේ ප්‍රසිද්ධ නොතාරිස් යූ. අයි. විජේතිලක විසින් සහතික කරන ලද 2002.11.08 වන දින අංක 11617, 2003.05.07 වන දින අංක 11793, 2004.06.15 වන දින අංක 12235 සහ 2005.03.29 වන දින අංක 12571 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. නමින් වූ බැඳුම්කරය යටතේ (පළවන උපලේඛනයේ සඳහන් දේපල) මොහොමඩ් තජුඩීන් මොහොමඩ් ෆාහිම් ණයකරු වශයෙන් සහ මාතලේ ප්‍රසිද්ධ නොතාරිස් යූ. අයි. විජේතිලක විසින් 2004.03.25 වන දින 12136 සහ 2007.07.30 වන දින සහතික කරන ලද අංක 13543 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. නමින් වූ බැඳුම්කරයන් යටතේ (දෙවන උපලේඛනයේ සඳහන් දේපල) මොහොමඩ් තජුඩීන් මොහොමඩ් ෆාහිම් ණයකරු වශයෙන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. වෙත ගෙවිය යුතුව හා අයවිය යුතුව ඇති මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් අනූ තුන් ලක්ෂ තිස්පන්දාස් අටසිය හතලිස් එකයි ශත පනස් එකක් (රු. 9,335,841.51) ක මුදලක් 2008 මාර්තු මස 12 දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. වෙත ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් එකී රුපියල් අනූ තුන් ලක්ෂ තිස්පන්දාස් අටසිය හතලිස් එකයි ශත පනස් එකක් (රු. 93,35,841.51) ක මුදල හා 2008 මාර්තු මස 13 වන දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 93,35,841.51 ක මුදලක් සඳහා වාර්ෂිකව 20% බැගින් වූ පොලිය ද ප්‍රචාරක වියදම් හා වෙනත් යම් ගෙවීමක් ඇතොත් ඒවාද මේ වන විට කරනු ලැබූ (යම්) ගෙවීමක් ඇතොත් එය ද අඩු කර අය කර ගැනීම සඳහා එකී අංක 11617, 11793, 12235, 12571, 12136 හා 13543 දරන බැඳුම්කර මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. වෙත උකස් කර ඇති මෙහි පහත උපලේඛනයේ වැඩිදුරටත් විස්තර කරන ලද දේපල හා පරිශ්‍රය මහනුවර, වටපුළුව, බෝමළුව පාරේ, අංක 83/5හි බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ පැවරී ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් සම්මත කර ගනී.

#### පළමුවන උපලේඛනය

මධ්‍යම පළාතේ මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ නගර සභා සීමාවන් තුළ ගොඩපොල පිහිටි පුල්ලියාලිවැටිය නරවත්ත නොහොත් සියඹලාගහමුල වෙදරාලගේ වත්ත නමැති ඉඩමට බලයලත් මානක කේ. කුමාරසාමි විසින් සාදන ලද 1955 ජූනි 7 වන දින අංක 1159 පිඹුරේ සඳහන් ලොට් ඒ දරන ඉඩමට බලයලත් මානක කේ. එස්. සමරසිංහ විසින් 1993 අප්‍රේල් 21 වැනි දින කරන ලද නැවත මැනුම අනුව එකී ලොට් ඒ දරන ඉඩමට මායිම් එනම්, උතුරට : කානුවෙන් සහ ගොඩපොල පාරෙන් ද, නැගෙනහිරට : ඉහත කී පිඹුරේ සඳහන් ලොට් බී දරන වරිපනම් අංක 22න් ද, දකුණට : කේ. වී. එස්. ලෙබ්බේ මරික්කාර්ගේ ඉඩම වෙන් වෙන ජීව වැටෙන් ද සහ බස්නාහිරට : වරිපනම් අංක 18 දරන දේපළෙන් ද යන මෙකී මායිම් තුළ පර්චස් තුනයි දශම හතරක් (අ. 0, රූ. 0, පර්. 3.4) විශාල ඉඩම හා එහි තුළ පිහිටි වරිපනම් අංක 20 දරන දේපළ හා ගොඩනැගිලි ඇතුළු අනෙකුත් සියලු දේ. මෙය මාතලේ ඉඩම් කාර්යාලයේ ඒ 80/111 හි ලියාපදිංචි කර ඇත.

#### දෙවන උපලේඛනය

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ නගර සභා සීමාවන් තුළ මුහන්දිරම් පාරේ පිහිටි කොස්ගහපැලවත්ත නමැති ඉඩමට බලයලත් මානක එම්. රාජසේකරන් විසින් සාදන ලද 2004.02.07 වන දින අංක 6087 දරන පිඹුරේ සඳහන් බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම් එනම්, උතුරට සහිරා විද්‍යාල පාරෙන් ද නැගෙනහිරට වරිපනම් අංක 33 හා සහිරා විද්‍යාල පාරෙන් ද දකුණ - බස්නාහිරට සදිකින් විසින් හිමිකම් කියන ලද ඉඩමෙන් ද බස්නාහිරට මුහන්දිරම් පාරෙන් ද යන මෙකී මායිම් තුළ පර්චස් පහළොවයි දශම නවයක් (අ. 0, රූ. 0, පර්. 15.9) විශාල ඉඩම හා එහි තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ වගාව ඇතුළු අනෙකුත් සියලු දේ. මෙය මාතලේ ඉඩම් කාර්යාලයේ ඒ 112/177 හි ලියාපදිංචි කර ඇත.

10-851/1

---

### ඩීඑෆ්සීසී බැංකුව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය ප්‍රකාර (ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කළින් හැඳින්වුණු) ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### අධ්‍යක්ෂ මණ්ඩලය යෝජනා සම්මතය

ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු ඩීඑෆ්සීසී බැංකුව නමට ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එම්. ඒ. එන්. ඩබ්. රාජකරුණා විසින් ලියා සහතික කරන ලද අංක 22541 හා 2005.03.18 වැනි දින දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම "චන්ද්‍රා එන්ජිනියර්ස් " යන නාමය, අභිධානය සහ ආයතනය යටතේ හවුල් ව්‍යාපාරයක් ලෙස නුගේගොඩ ව්‍යාපාරය කරගෙන යන නුගේගොඩ දෙදෙනාම පදිංචි ඕමන්තගේ දයා කල්දේරා (විවාහයට පෙර පෙරේරා) නොහොත් ඕමන්තගේ දයාවතී කල්දේරා (විවාහයට පෙර පෙරේරා) සහ හොල්ලුපතිරගේ කපිල

ප්‍රශාන් කල්දේරා නොහොත් හොලු පතිරගේ කපිල ප්‍රසාන්ත් කල්දේරා යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, දැනට ඉහත කී අංක 22541 දරන උකස් බැඳුම්කරය මත එකී ඕමත්තගේ දයා කල්දේරා සහ හෝල්ලුපතිරගේ කපිල ප්‍රෂාත් කල්දේරා යන අයගෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් නව ලක්ෂ හැටනව දහස් හාරසිය විසි හතරකුත් ශත දහතුනක (රු. 9,69,424.13) මුදලක් 2008 ජූලි මස 01 වැනි දින සිට විකිණීමේ දිනට දක්වා එයින් රුපියල් හත්ලක්ෂ අනූ දෙදහස් නවසිය අනූහතක් (රු. 7,92,997) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන්මසකට වරක් ප්‍රතිශෝධනය කර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සතිපතා පදනම මත පළකරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොලි අනුපාතිකයක් (ඒ. ඩබ්ලිව්. පී. ආර්.) වර්ෂයකට සියයට හතක් (7%) ඉහල අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහල 0.5%ට තීන්දු කරන අනුපාතිකයක් මත පොළිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල වන රුපියල් නව ලක්ෂ හැටනව දහස් හාරසිය විසි හතරකුත් ශත දහතුනක (රු. 9,69,424.13) මුදලක් සහ 2008 ජූලි මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් හත්ලක්ෂ අනූ දෙදහස් නවසිය අනූහතක් (රු. 7,92,997) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන්මසකට වරක් ප්‍රතිශෝධනය කර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සතිපතා පදනම මත පළකරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ. ඩබ්ලිව්. පී. ආර්) වර්ෂයකට සියයට හතක් (7%) ඉහල අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහල 0.5%ට තීන්දු කරන අනුපාතිකය මත පොලිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාල ඉඩම හා පරිශ්‍රය විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය අනුව හා එකී උකස් බැඳුම්කරයේ ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැයකර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු සමග අයකර ගැනීම සඳාහ ඉහත කී අංක 22541 දරන උකස් බැඳුම්කරය මගින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස්කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වු 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

### අංක 22541 දරන උකස් බැඳුම්රය මගින් උකස් කරන ලද දේපළ විස්තරය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහනගර සභා සීමාව ඇතුළත පාගොඩ පිහිටි පාගොඩ පාරේ වරිපනම් අංක 19සී සහ 19 සී 1/1 දරන වැලිකුඹුර නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු වී. ඒ. එල්. සේනාරත්න විසින් මැන සාදන ලද අංක 3416ඒ හා 1966.06.27 දින දරන පිඹුරේ දැක්වෙන ලොට් අංක 11 ලකුණු කළ බෙදා වෙන් කල බිම් කට්ටිය වන උතුරට : ලොට් අංක 10 ද, නැගෙනහිරට : පාගොඩ පාර ද, දකුණට : ලොට් අංක 26 ද, බස්නාහිරට : ලොට් අංක 12 සහ 25 ද යන මායිම් ඇතුළත පර්චස් දහඅටක (අ. 0, රූ. 0, පර්. 18) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, වැව්ලි සහ වෙනත් සියලු දේ.

මැතකදී කරන ලද මැනීමකට අනුව ඉහත කී ලොට් 11 දරන බිම් කට්ටිය පහත දැක්වෙන පරිදි විස්තර කර ඇත.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා සීමාව ඇතුළත පාගොඩ පිහිටි පාගොඩ පාර වරිපනම් අංක සී/19 සහ සී 1/1/19 දරන "වැලිකුඹුර" නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ඒ. ඊ. විජේසූරිය විසින් මැන සාදන ලද අංක 4339 හා 1994.12.23 දින දරන පිඹුරේ දැක්වෙන ලොට් "ඒ " ලෙස ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටිය වන උතුරු-නැගෙනහිරට : අංක 3416ඒ දරන පිඹුරේ ලොට් අංක 10 ද, දකුණු-නැගෙනහිට : පාගොඩ පාර ද, දකුණු-බස්නාහිරට : අංක 3416ඒ දරන පිඹුරේ ලොට් අංක 26 ද, උතුරු-බස්නාහිරට : අංක 3416ඒ දරන පිඹුරේ ලොට් අංක 12 සහ 25 ද යන මායිම් ඇතුළත් පර්චස් දහඅටක් (අ. 0, රූ. 0, පර්. 18) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, වැව්ලි සහ වෙනත් සියලු දේ.

ඒ. එන්. ෆොන්සේකා,
අධ්‍යක්ෂ/සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලු පාර,
කොළඹ 03.

10-853/1

---

## ඩීඑෆ්සීසී බැංකුව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය ප්‍රකාර (ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු) ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකඡන්දයෙන් සම්මත කරගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු ඩීඑෆ්සීසී බැංකුව නමට කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් ටී. එස්. අයි. වැත්තෑව ලියා සහතික කළ අංක 1981 හා 2003.09.18 දින දරන උකස් බැඳුම්කර මත සහ කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් එස්. බී. වඳුරාගල ලියා සහතික කළ අංක 13384 සහ 13386 හා 2006.07.21 දින දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම "ලහිරු පදම්කල හුණු නිෂ්පාදකයෝ" යන නාමය අභිධානය සහ ආයතනය යටතේ තනි අයිතිකරු ලෙස තුම්මෝදර ව්‍යාපාරය කරගෙන යන රන්කොත් පේඩිගේ සඳකැලුම් ලලන කුමාර අමරවංශ යන අය විසින් පැහැර හැර ඇති හෙයින්ද 2008 ජුනි 30 වැනි දිනට, ඉහත කී අංක 1981, 13384 සහ 13386 දරන උකස් බැඳුම්කර මත එකී රන්කෝත් පේඩිගේ සඳකැලුම් ලලන කුමාර අමරවංශ යන අයගෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් විසිපන් ලක්ෂතිස්පන් දහස් නවසිය හයකුත් ශත තිස්තුනක (රු.25,35,906.33) මුදලක් සහ 2008 ජූලි 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් එක් ලක්ෂ තිස්හත් දහස් නවසිය විස්සක් (රු.1,37,920) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන්මසකට වරක් ප්‍රතිශෝධනය කර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සතිපතා පදනම මත පළකරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ. ඩබ්.පී. ආර්) වර්ෂයකට සියයට හතක්(7%) ඉහල අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහල 0.5% ට තීන්දු කරන අනුපාතිකයක් වන, එහෙත් වර්ෂයකට සියයට විසිහතක් (27%) නොඉක්මවිය යුතු හා සියයට දහඅටට (18%) අඩු නොවිය යුතු

අනුපාතිකයක් මත පොලිය සහ රුපියල් විසිඑක් ලක්ෂ පනස් හය දහස් අටසිය හැත්තෑ අටකුත් ශත අනූ අටක් (රු.21,56,878.98) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන් මසකට වරක් ප්‍රතිශෝධනය කර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සතිපතා පදනම මත පළ කරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ. ඩබ්. පී. ආර්.) වර්ෂයකට සියයට හතකුත් දශම පහක් (7.5%) ඉහල අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහල 0.5%ට තීන්දු කර අනුපාතිකය මත පොලිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින්ද,

ඉහත කී උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල වන රුපියල් විසිපන් ලක්ෂ තිස්පන් දහස් නවසිය හයකුත් ශත තිස්තුනක (රු.25,35,906.33) මුදල සහ 2008 ජූලි 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් එක් ලක්ෂ තිස්හත් දහස් නවසිය විස්සක් (රු.1,37,920) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන්මසකට වරක් ප්‍රතිශෝධනය කර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සතිපතා පදනම මත පළකරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ. ඩබ්ලිව්. පී. ආර්) වර්ෂයකට සියයට හතක් (7%) ඉහල අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහල 0.5% ට තීන්දු කරන අනුපාතිකයක් වන, එහෙත් වර්ෂයකට සියයට විසිහතක් (27%) නොඉක්මවිය යුතු හා සියයට දහඅටට (18%) අඩු නොවිය යුතු අනුපාතිකයක් මත පොලිය සහ රුපියල් විසිඑක් ලක්ෂ පණස් හය දහස් අටසිය හැත්තෑ අටකුත් ශත අනූ අටක් (රු.21,56,878.98) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන් මසකට වරක් ප්‍රතිශෝධනය කරන ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සතිපතා පදනම මත පළ කරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ. ඩබ්. පී. ආර්) වර්ෂයකට සියයට හතකුත් දශම පහක් (7.5%) ඉහල අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහල 0.5% ට තීන්දු කරන අනුපාතිකය මත පොලිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය සහ එහි පිහිටි ගොඩනැගිලි විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු ද 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය අනුව හා එකී උකස් බැඳුම්කරයේ ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැයකර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 1981, 13384 හා 13386 දරන උකස් බැඳුම්කර මගින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම් හා පරිශ්‍ර සහ එහි පිහිටි ගොඩනැගිලි කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

**අංක 1981 හා 13384 දරන උකස් බැඳුම්කර මගින් උකස් කරන ලද දේපළ විස්තරය**

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුලියාපිටිය ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ, දකුණු කටුගම්පල කෝරලේ, කටුගම්පල හත්පත්තුවේ දූනකදෙණියේ පිහිටි "දූනකදෙණිය එස්ටේට්" නමැති ඉඩමේ, බලයලත් මිනින්දෝරු එස්. ඩී. කරුණාසේන විසින් මැන සාදන ලද අංක 39 හා 2003.05.25 දින දරන පිඹුරේ දැක්වෙන ලොට් අංක 1 ලෙස ලකුණු කළ බිම් කට්ටිය වන උතුරට : එච්. ඒ. ඩී. එම්. අයි. පැට්‍රිෂියා පෙරේරාට අයිති ඉඩම සහ ඒකනායකගේ ඉඩම ද, නැගෙනහිරට : පිට ඇල සහ සන්දනායකගේ ඉඩම ද, දකුණට : ඩබ්ලිව්. ජේ. ජයන්ත ක්‍රිස්ටෝපර් හිමිකම් කියන ඉඩම සහ ප්‍රධාන පාරේ සිට මෙම දේපළට එන පාර ද, බස්නාහිරටः එච්. ඒ. ඩී. එම්. පැට්‍රිෂියා පෙරේරාට අයිති ඉඩම ද යන මායිම් ඇතුළත අක්කර දෙකකුත් පර්චස් පහළොවක් (අ. 2, රූ.0, පර්. 15) බිම් ප්‍රමාණයෙන් යුතු ඉඩම ද සහ එහි පිහිටි සියලු දේ. ඉහත කී පිඹුරේ දැක්වෙන මාර්ග අයිතිවාසිකම ද මෙයට ඇතුළත් වේ.

**අංක 13386 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය**

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, මැද පත්තුවේ දකුණු පිටිගල් කෝරලේ පහල කොට්ටාරමුල්ල ග්‍රාමයේ පිහිටි "මැල්ලකැලේ" නමැති ඉඩමේ, බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. එස්. ඩී. කරුණාසේන විසින් මැන සාදන ලද අංක 903 හා 2005.12.04 දින දරන පිඹුරේ ලොට් අංක 1 ලෙස ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටිය වන, උතුරට : ආර්. පී. සීමන්ගේ ඉඩම, ආර්. පී. චමින්දගේ ඉඩම, සහ කමනී දිස්නා ප්‍රනාන්දුගේ ඉඩම ද නැගෙනහිරට : එල්. ආර්. එච්. එස්. ප්‍රියදර්ශනගේ ඉඩම, පාර සහ කමනි දිස්නා ප්‍රනාන්දුගේ ඉඩම ද, දකුණට : ආර්. පී. අමාරිස්ගේ ඉඩම ද, බස්නාහිරට ජයන්ත මාරසිංහට අයිති ඉඩම ද යන මායිම් ඇතුළත රූඩ් තුනකුත් පර්චස් විසි අටයි දශම අටක් (අ. 0, රූ. 3, පර්. 28.8) විශාලත්වය ඇති ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, වැව්ලි සහ ඊට අනුබද්ධ වෙනත් සියලු දේ.

ඒ. එන් ෆොන්සේකා,
අධ්‍යක්ෂ/සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලු පාර,
කොළඹ 03.

10-853/2

---

## සෙලාන් බැන්ක් පී. එල්. සී. - ප්‍රයිවට් බැංකිං යුනිට් ශාඛාව

(2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අත්කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය.

සෙලාන් බැන්ක් පී. එල්. සි. හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.04.04 දින පවත්වන්නට යෙදුණු රැස්වීමේදී, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වෙනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගිණුම් අංකය : 9957 - 00330252 - 001

ශ්‍රී ලංකා ජනරජයේ කන්තලේ සීනිපුර ඒටීඑල් ෆාම් හි සිය ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇති ශ්‍රී ලංකාව තුල සංස්ථාපිත සමාගමක් වන ඇග්‍රෝ ට්‍රේඩිං ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් යන අය සෙලාන් බැන්ක් පී.එල්.සී නමින් එකී ඇග්‍රෝ ට්‍රේඩිං ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් ක්‍රියාත්මක

කරන ලද 2005.10.04 දිනැති ත්‍රිකුණාමලය ඉඩම් ලියාපදිංචි කර්යාලයේ ජී. එම්./10/152 යටතේ ලියා පදිංචි කරන ලද යන්ත්‍ර සූත්‍ර උකස් ඔප්පුව මත අයවිය යුතු මුදල් ගෙවීම, බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී ඇග්‍රෝ ට්‍රේඩිං ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් ක්‍රියාත්මක කරන ලද 2005.10.04 දිනැති ත්‍රිකුණාමලය ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ අංක පී. එම්./10/152 යටතේ ලියාපදිංචි කරන ලද යන්ත්‍ර සූත්‍ර උකස් ඔප්පුව යටතේ රුපියල් දෙකෝටි හැටහතරලක්ෂ හතලිස් පන් දහස් නවසිය පනස් හතරයි ශත විසි පහක (රු. 2,64,45,954.25) මුදලක් 2006 සැප්තැම්බර් 30 වෙනි දින වන විට සෙලාන් බැංකුව පී. එල්. සී. වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින්ද එකී රු. 2,64,45,954.25 මුදල ද, 2006 ඔක්තෝබර් 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් තුන (33%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුණු වෙනත් ගාස්තුද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස එකී ඇග්‍රෝ ට්‍රේඩිං ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් ක්‍රියාත්මක කරන ලද 2005.10.04 දිනැති ත්‍රිකුණාමලය ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ අංක පී. එම්. 10/152 යටතේ ලියාපදිංචි කරන ලද යන්ත්‍ර සූත්‍ර උකස් ඔප්පුව මගින් මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති යන්ත්‍ර සූත්‍ර කට්ටල සහ යන්ත්‍ර සූත්‍ර බලයලත් වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැන්ක් පී. එල්. සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

| | මේක්/මොඩ්ල් | ටයිප් | මැෂින් අංකය |
|---|---|---|---|
| 01. | ඩොමිනේටර් හාරවස්ටර් | 156 | 156-07927 |
| 02. | ජෝන් ඩියර් පෝවිල් ට්‍රැක්ටරය | 6205 | L6205M294172 |
| 03. | ජෝන් ඩියර් පෝවිල් ට්‍රැක්ටරය | 6205 | L06205M294527 |
| 04. | ෆෝඩ් 4 විල් ට්‍රැක්ටරය | 363D7 | 55278ANORA - 1 |
| 05. | ෆෝඩ් 4 විල් ට්‍රැක්ටරය | 8340 | WK553796 |
| 06. | විඩර් - ඇමසෝනන් වර්ක් | ED601 | |
| 07. | රෙන් ස්ටාර් T75-270 වතුර මෝටරය | VM-MOTORI | 2105MEC-MR - 65/3/2A |
| 08. | ඇමසොනන් ප්ලාන්ටර් | ED601 | |
| 09. | ඇමසෝනන් ඩිස්ක් හැරෝ | | B402SE300A54 |
| 10. | තායි හැරෝ | 160-724 | 160-724 |
| 11. | ස්වයංක්‍රීය බර කිරන යන්ත්‍රය | Wegeberich | |
| 12. | වානේ ටැංකි 3 - හොපරි බොටම් | ටන්ට්‍රි | 101, 102, 103 |
| 13. | ග්‍රේන් ක්ලීනර් | Flower Wrstrup | |
| 14. | බකට් එලිවේටර්ස් 3 යි | Flower Wrstrup | |
| 15. | ඩ්‍රයර්, බර්නරය සමග | SL1000 | |
| 16. | MSසිලින්ඩරාකාර ඩීසල් ටැංකිය fපිට්ංස් සහ වැල්ස් සමග | | |
| 17. | බෙල්ට් කන්වෙයර් ස්ටාටරය සහ ජියර් බොක්ස් සමග | | FL0309 |
| 18. | ඩීසල් ටෙම්පස්ට් ජෙනරේටරය | වොල්වෝ පෙන්ටා | 0141605-09 |
| 19. | රූම් එයා කන්ඩිෂනර් | හේයර් | |
| 20. | එයා කන්ඩිෂනර් ස්පලිට් ටයිප් | එල්ජී | LSK1862CI |
| 21. | ඒවරි බර කිරන යන්ත්‍ර | එස්එල් 3901AAG | 2K 102 |
| 22. | ඔක්සි ඇසිටලින් වෙල්ඩින් සෙට් | | |
| 23. | පෙඩස්ට්ල් ඩ්‍රිල් | SJQ-5132 | SJQ5132 |
| 24. | ලැබ්‍රබෝ රිපර්ස් (02යි) | ලෙම්කෙම් | WO2402154 |
| 25. | ඇමසෝනන් fපර්ටිලයිසර් ස්ප්‍රෙඩරය | | |
| 26. | ඔස්ට්‍රියන් බවර් රේන් ස්ටාර් | T131 | 00X131278 |
| 27. | සීඩීඑස්/බස්ට් රිමූවර් (02යි) | | |
| 28. | ඕගර්ස් (02යි) | | |
| 29. | ස්ප්‍රේයර්ස් 25 යි | පියර්ස් mdla | |
| 30. | ගොවිපොළ උපකරණ අමතර කොටස් සහ ෂෙඩ් මෙට්ංස් | | |
| 31. | Reho ප්ලවු (නගුල) | | |
| 32. | ඉලෙක්ට්‍රික් පෙන්සිං අයිටම්ස් | | |
| 33. | ටැන්ට්‍රි ට්‍රේලර්ස් 02 ක් සහ ට්‍රේලර් මවුන්ටඩ් වතුර බවුසර් 01 යි | | |
| 34. | ආක් වෙල්ඩිං ට්‍රාන්ස්පෝමර | WLNE350A/S | 401213 |

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එම්. කේ. ප්‍රේමතිලක,
සහකාර සාමාන්‍යාධිකාරි - නීති

10-678/1

### සෙලාන් බැංකුව පීඑල්සී - හෝමාගම ශාඛාව/ෆොරින් කරන්සි බෑන්කිං යුනිට්

(2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත)

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

ගිණුම් අංක : 0430-03576310 - 001
0430 - 03576310 - 040

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලයේ විසින් 2008.09.10 දින පවත්වන්නට යෙදුණු රැස්වීමේදී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් හා ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් ටී. එච්. ඩී. එල්. එල්. ජයසේකර විසින් දෙකම සහතික කරන ලද 2005 ඔක්තෝබර් 24 දිනැති අංක 1181 දරන බැඳුම්කරය සහ 2005 ඔක්තෝබර් මස 24 වැනි දිනැති අංක 1182 දරන යන්ත්‍රසූත්‍ර බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, කොළඹ 03 ලියාපදිංචි අංක : එන්(පීවීඑස්) 7851 දරන 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ සංස්ථාපිත සමාගමක් වන ටයිම් ගාමන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ (ඇමෙරිකානු ඩොලර් 1,661,005.90) දහහත්කෝටි අනූතුන් ලක්ෂ අසූ අට දහස් හයසිය තිස් හතයි ශත විස්සකට (රු. 17,93,88,637.20 කට සමාන) මුදලක්, 2008 පෙබරවාරි 13 වෙනි දින වන විට ඇසුරුම් ණය (පැකිං ක්‍රෙඩිට් ලෝන්) සහ අයිරා අනකර පහසුකම් වෙනුවෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින්ද එකී ඇමෙරිකානු ඩොලර් 1,661,005.90 (රු. 17,93,88,637.20කට සමාන) මුදල ද, 2008 පෙබරවාරි 14 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම ඇසුරුම් ණය වෙනුවෙන් වර්ෂයකට සියයට නවයයි දශම තුනයි හයක් (9.36%) සහ අයිරා අණකර වෙනුවෙන් සියයට දොළහයි දශම දෙකයි පහ (12.25%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුණු වෙනත් ගාස්තුද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර ගැනීම පිණිස ඉහත කී අංක 1181 සහ 1182 දරන බැඳුම්කර මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් 1 වෙනි සහ 2 වෙනි උපලේඛනවල සවිස්තරව විස්තර කර ඇති දේපල සහ යන්ත්‍රසූත්‍ර බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

#### 1 වෙනි උපලේඛනය

1. බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරළේ පල්ලේ පත්තුවේ හෝමාගම පල්ලේ පත්තුවේ දැන් හෝමාගම සහකාර ආණ්ඩුවේ ඒජන්තගේ කොට්ඨාසය තුළ කොළඹ සංවර්ධන සභාවේ ඒකක 2 හි හෝමාගම ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාසය තුළ හෝමාගම කටුවාන පාර දිගේ පිහිටි මිනුම්පති විසින් වලංගු කරන ලද 1990 මැයි 28 දිනැති අංක කො. 6996 දරන මූලික සැලැස්මේ පෙන්නුම් කරනු ලබන කැකුණලන්ද නමැති ඉඩමේ ලොට් 141 ලකුණු කල බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම් : උතුරට : ලොට් 139, 142 සහ 143 ද, නැගෙනහිරට : ලොට් 144 සහ 149 ද, දකුණට : ලොට් 149 සහ බස්නාහිරට : ලොට් 140 ද යන මායිම් තුල එකී අංක කො. 6996 දරන සැලැස්ම අනුව හෙක්ටයාර බිංදුවයි දශම එකයි නවයයි හතයි බිංදුවක් (හෙක්ටයාර් 0.1970) විශාල, ඉඩම. මෙය හෝමාගම ඉඩම් ලියා පදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රිරුව ජී877/75 යටතේ ලියාපදිංචි කර ඇත.

2. බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරළේ පල්ලේ පත්තුවේ කොළඹ සංවර්ධන සභාවේ හෝමාගම උප කාර්යාල අංක 2 සීමාව තුළ හෝමාගම කටුවාන පාර දිගේ පිහිටි මිනුම්පති විසින් වලංගු කරන ලද 1990 මැයි 28 දිනැති අංක කො 6996 දරන මූලික සැලැස්මේ පෙන්නුම් කරන ලබන කැකුණලන්ද නමැති ඉඩමේ ලොට් 144 ලකුණු කල බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : එකී අංක 6996 දරන සැලැස්මේ සඳහන් ලොට් 142, 143 සහ 146 ද, නැගෙනහිරට : එකී අංක 6996 දරන සැලැස්මේ සඳහන් ලොට් 145 සහ 149 ද, දකුණට : එකී අංක 6996 දරන සැලැස්මේ සඳහන් ලොට් 149 සහ 141 සහ බස්නාහිරට : ලොට් 141 ද යන මායිම් තුළ එකී අංක කො. 6996 දරන මූලික සැලැස්ම අනුව හෙක්ටයාර් බිංදුවයි දශම එකයි හතයි පහයි බිංදුවක් (හෙක්ටයාර 0.1750) විශාල, එහි පිහිටි සියලු දේ සමග ඉඩම. මෙය හෝමාගම ඉඩම් ලියා පදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/ පත්‍රිරුව පී 828/269 යටතේ ලියාපදිංචි කර ඇත.

3. බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරළේ පල්ලේ පත්තුවේ කොළඹ සංවර්ධන සභාවේ හෝමාගම උප කාර්යාල අංක 2 සීමාව තුල හෝමාගම කටුවාන පාර දිගේ පිහිටි මිනුම්පති විසින් වලංගු කරන ලද 1990 මැයි 28 දිනැති අංක කො. 6996 දරන මූලික සැලැස්මේ පෙන්නුම් කරනු ලබන කැකුණලන්ද නමැති ඉඩමේ ලොට් 145 ලකුණු කල බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම් : උතුරට : එකී අංක 6996 දරන සැලැස්මේ සඳහන් ලොට් 143. 146 සහ 147 ද, නැගෙනහිරට : එකී අංක 6996 දරන සැලැස්මේ සඳහන් ලොට් 148 සහ 149 ද, දකුණට : එකී අංක 6996 දරන සැලැස්මේ සඳහන් 149 සහ 144 සහ බස්නාහිරට : ලොට් 144 දරන මායිම් තුළ එකී අංක කො. 6996 දරන සැලැස්ම අනුව හෙක්ටයාර බිංදුවයි දශම එකයි නවයයි හතයි තුනක් (හෙක්ටයාර 0.1973) විශාල, එහි පිහිටි සියලු දේ සමග ඉඩම. මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රිරුව පී 828/251 යටතේ ලියාපදිංචි කර ඇත.

පහත සඳහන් මාර්ගය සඳහා වෙන්කිරීම් තුළ, දිගේ සහ උඩින් පාවිච්චි කිරීමේ පූර්ණ සහ නිදහස් අයිතිය සමග.

පෙරකී හෝමාගම කටුවාන පාර පිහිටි එකී කො. 6996 දරන මූලික සැලැස්මේ පෙන්නුම් කරනු ලබන කැකුණලන්ද නමැති ඉඩමේ ලොට් 149 ලකුණු කල බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : අංක කො. 6706 දරන මූලික සැලැස්මේ සඳහන් ලොට් 2 සහ ලොට් 140 ද, 141, 144, 145, 148, 150 සහ 153 ද, නැගෙනහිරට : ලොට් 53 ද, දකුණට : පී. පී. හපුදෙනිය, එස්. එස්. රාමනායක සහ ඩී. පී. රාමනායක විසින් හිමිකම්

කියනු ලබන මිල්ලගහවත්ත නමැති ඉඩම, ලොට් 34 (පාර) සහ ලොට් 35 සහ බස්නාහිරට : කටුවාන පාර ද යන මායිම් තුළ එකී අංක කො. 6996 දරන මූලික සැලැස්ම අනුව හෙක්ටයාර බිංදුවයි දශම හතරයි එකයි හතරක් නවයක් (හෙක්ටයාර 0.4149) විශාල ඉඩම.

## දෙවෙනි උපලේඛනය

| *අයිතම* | *විස්තරය* | | | | |
|---|---|---|---|---|---|
| | *වර්ගය* | *මාදිලි අංක* | *නිෂ්පාදිත රට* | *මිලටගත් වර්ෂය* | *ඒකක ගණන* |
| 01 | තනි ඉඳිකටු මහන මැෂින් | | | | |
| | ජුකී | ඩීඩීඑල් 8500 | ජපානය | 1989 | 50 |
| | ජුකී | ඩීඩීඑල් 8500 | ජපානය | 1993 | 15 |
| | ජුකී | ඩීඩීඑල් 8500 | ජපානය | 1997 | 15 |
| | ජුකී | ඩීඩීඑල් 8500-7 | ජපානය | 2000 | 24 |
| | ටොයටා | එල්එස් 2 - ඒඩී 140 | ජපානය | 1991 | 52 |
| | සන් ස්ටාර් | එල්එස් 2 - ඒඩී140 | කොරියාව | 1998 | 02 |
| | බ්‍රදර් | එස්එල් 737-403 | චීනය | 2002 | 14 |
| | | | | | 172 |
| 02 | ද්විත්ව ඉඳිකටු මහන මැෂින් | | | | |
| | ජුකී | එල්එච් 1162 | ජපානය | 1989 | 12 |
| | ජුකී | එල්එච් 1162 | ජපානය | 1998 | 21 |
| | | | | | 33 |
| 03. | බාර්ටැක් මැෂින් | | | | |
| | බ්‍රදර් | කේඊ 430607 | චීනය | 1991 | 08 |
| | ජුකී | එල්කේ 1850/1900 | ජපානය | 1992 | 12 |
| | බ්‍රදර් | KE 430BI | චීනය | 2003 | 04 |
| | | | | | 24 |
| 04. | ඕවර්ලොක් මැෂින් | | | | |
| | ජුකී | එම්ඕ2366එන් | ජපානය | 1992 | 14 |
| | ජුකී | එම්ඕ2366එන් | ජපානය | 1998 | 20 |
| | පෙගසස් | කේඑල් 52-55 | ජපානය | 1998 | 04 |
| | | | | | 38 |
| 05. | වෙල්කො අටැචර් | | | | |
| | ජුකී | එල්කේ 1930 | ජපානය | | 01 |
| 06. | ස්නැප් බටන් මැෂින්ස් | එන්එස්45 | ජපානය | 1999 | 04 |
| 07. | කන්සායි ස්පෙෂල් | ඩීඑෆ්බී1404පී | ජපානය | 1999 | 04 |
| 08. | අයි බටන් හෝල් මැෂින් | රිස් ඒඑම්එෆ් 101 | ජපානය | 1998 | 01 |
| 09. | පියුසිං මැෂින් | ඔෂිමා ඕපී-45ඊඑෆ් | ජපානය | 1999 | 01 |
| 10. | ත්‍රෙඩ් මැෂින් | හෂීමා එච්ඩබ්ලිව්40 | ජපානය | 1999 | 01 |
| 11. | බටන්හෝල් මැෂින් | ජුකීඑල්බීඑච්780 | ජපානය | 1998 | 03 |
| 12. | නීඩ්ල් ඉන්ස්පෙක්ෂන් මැෂින් | සින්ටෙක්ස් කේඑස් 242 | කොරියාව | 1999 | 01 |
| 13. | බිග් පිම් | වියට් 8740 | කොරියාව | 1998 | 01 |
| 14. | එයාර් කම්ප්‍රෙෂර් | බෙබ්කොන් | කොරියාව | 1998 | 01 |

| | වර්ගය | මාදිලි අංක | නිෂ්පාදිත රට | මිලටගත් වර්ෂය | ඒකක ගණන |
|---|---|---|---|---|---|
| | | fපියැක් ජ්පී 011-100 | ඉතාලිය | 1999 | 01 |
| | | කේට් 200 | ඉතාලිය | 1998 | 01 |
| 15. | බොයිලර් | වියට් | ඇමෙරිකාව | 1998 | 01 |
| 16. | ඉස්තිරික්ක සඳහා බොයිලර් | සස්බෑන් ඊඑස් 80 | ඇමෙරිකාව | 1999 | 01 |
| 17. | ඩ්‍රයර් | ඇස්ටර් ඩී 1001 | කොරියාව | 1999 | 01 |
| 18. | ෆීඩ් ඔෆ් ද ආර්ම් | යූනියන් ස්පෙෂල් 35800ඩීඕ | ජපානය | 2000 | 02 |
| 19. | බට්න් අටැචර් | ජුකී එම්බී 372 | ජපානය | 2000 | 01 |
| 20. | කොලර් පොයින්ට් මැෂින් ටීඑස්ඩී 2 | | කොරියාව | 1998 | 01 |
| 21. | බෙන්ච් ග්‍රයින්ඩර් | | දේශීය | 1989 | 01 |
| 22. | එන්ඩ් කටර් | සුලී | කොරියාව | 1998 | 02 |
| 23. | ස්ට්‍රේට් නයිෆ් කටර් | ඊස්ට්මන් | ඇමෙරිකාව | 1999/2000 | 04 |
| 24. | පැබ්රික් ඉන්ස්පෙක්ෂන් මැෂින් | එම්ඊඑෆ් 25 | කොරියාව | 2000 | 01 |
| 25. | කලර් මැචිං මැෂින් | කේ 232 | කොරියාව | 1999 | 01 |
| 26. | අයන් ටේබල්ස් | සිල්වර් ස්ටාර් | කොරියාව | 1999 | 08 |
| 27. | වැකුම්ං ටේබල්ස් | නැමාටෝ | කොරියාව | 1999/2000 | 07 |
| 28. | අයන්ස් | සිල්වර් ස්ටාර් කේ 536 | කොරියාව | 1999/2000 | 19 |
| 29. | ලෙක්ට්‍රා මැෂින් | මොඩ්ල් වී 4 | | | |
| | | එම්ඩී - බීඑස්සීසීඅයිසීඑම්ඕඩී - වී 4 | | | |
| | | එම්ඩී - fප්‍රොප්රේඩර් - වී 4 | | 2003 | 01 |
| 30. | ඩෙල් පවර් | ඩීඑච්ර් 1300 සර්වර් | | 2000 | 01 |
| | | ඩෙල් ඔප්ටිප්ලෙක්ස් පීඑක්ස් 110 | | 1998 | 02 |
| | | | | 1999 | 02 |
| | | | | 2000 | 01 |
| | | | | 2002 | 01 |
| | | | | 2003 | 01 |
| | | ඩෙල් ඔප්ටිප්ලෙක්ස් පීඑක්ස් 240 | | 2000/01 | 02 |
| | | | | 2002 | 01 |
| | | අයිබීඑම් | | 2000/01 | 06 |
| | | අසෙම්බල්ඩ් පීසී | | 1999 | 04 |
| | | | | 1999 | 01 |
| | | | | 2001/02 | 02 |
| | | අසෙම්බල්ඩ් පීසී පී iii - ජ්එම්ඩී | | 2001 | 02 |
| | | පී ii - 300 එම්එච් ඉසෙඩ් | | 2001 | 01 |
| | | පී ii | | 2002 | 05 |
| | | පී ii - 200 එම්එච්ඉසෙඩ් | | 2001 | 01 |
| | | පී ii | | 2001 | 02 |
| | | පී iii | | 2003 | 01 |
| | එල්එස්යූඑස්එස් | පී ii | | 2001 | 01 |
| | අයිපීඑස් | පී ii- ජ්එම්ඩී | | 2001 | 01 |
| | | NEC | | 2001 | 02 |

| | වර්ගය | මාදිලි අංක | නිෂ්පාදිත රට | මිලටගත් වර්ගය | ඒකක ගණන |
|---|---|---|---|---|---|
| 31. | පොටෝකොපි මැෂින් | | | 2003 | 01 |
| | ටොෂිබා මොඩ්ල් 1370 | | | 2000 | 01 |
| 32. | පැක්ස් මැෂින් | | | | |
| | ටොෂිබා මොඩ්ල් 1045 | | | 2000 | 01 |
| 33. | කම්යුනිකේෂන් සිස්ටම් | | | | |
| | ටෙලිපෝන් 30 ඉන්ස්ට්‍රුමන්ට්ස් | | | | |
| | සැම්සුං කී සිස්ටම් - කොරියා | | | 1999/2001 | |
| 34. | පබ්ලික් ඇඩ්‍රස් සිස්ටම් | | | | |
| | ස්පීකර්ස් ඇම්ප්ලිපයර්ස් | | | | |
| | ටියුනර් සමග | | | | |
| 35. | එයාර් කන්ඩිෂනර්ස් | | | | |
| | ජේන් එයාර් ස්ප්ලිට් ටයිප් | | | | |
| | මොඩ්ල් කේ 254 සහ 254 - ඩී 1 | | තායිලන්තය | 2000 | 09 |
| | එල්පී ස්ප්ලිට් ටයිප් | | | | |
| | මොඩ්ල් එස් 20 | | කොරියාව | 2002 | 01 |
| | ඇල්පයින් ස්ප්ලිට් ටයිප් | | | | |
| | මොඩ්ල් කේසී 421 | | කොරියාව | 2002 | 02 |
| | පයනියර් ස්ප්ලිට් ටයිප් | | | | |
| | මොඩ්ල් පීඑප් 440 | | කොරියාව | 2002 | 01 |
| | යූඒර් - ස්ප්ලිට් ටයිප් | | | | |
| | මොඩ්ල් කේසී 502 | | කොරියාව | 2002 | 02 |
| | පයනියර් ප්ලෝමවුන්ටඩ් | | | | |
| | පැකේජ් ටයිප් | | | | |
| | මොඩ්ල් කේඑප් 120 එල් | | කොරියාව | 2003 | 05 |
| 36. | විල්සන් ජෙනරේටර් | | | | |
| | මොඩ්ල් පී 250එච් | | | | |
| | ධාරිතාව 250 කේවීඒ | | එක්සත් රාජධානිය | 2002 | 01 |
| 37. | ලීබඩු | | | | |
| | හයිබැක් - විධායක වානේ පුටු | | | | 32 |
| | විධායක වානේ පුටු - ඇඳි උස | | | | 04 |
| | කුඩා පුටු - වානේ | | | | 30 |
| | පුටු - වානේ සහ දැව | | | | 554 |
| | විධායක මේස වානේ | | | | 47 |
| | පිළිගැනීමේ මේස | | | | 01 |
| | මේස - වානේ සහ දැව (ලයින්ස්) | | | | 226 |
| | ආපන ශාලා මේස - වානේ සහ දැව | | | | 24 |
| | කටිං ටේබල් (ස්ටැන්ඩර්ඩ්) වානේ සහ දැව | | | | |
| | 87" x 6" x 2.9 | | | | 02 |
| | කටින් ටේබල් (ස්ටෑන්ඩර්ඩ්) | | | | |
| | වානේ සහ දැව | | | | 19 |
| | ප්ලාස්ටික් රාක්ක | | | | 25 |
| | දැව රාක්ක | | | | 38 |
| | වානේ කබඩ් | | | | 30 |
| | වානේ ලාච්චු | | | | 21 |

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එම්. කේ. ප්‍රේමතිලක,
සහකාර සාමාන්‍යාධිකාරී - නීති.

10-678/5

## ඩීඑෆ්සීසී බැංකුව

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය ප්‍රකාර (ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු) ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකච්ඡන්දයෙන් සම්මත කරගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු ඩීඑෆ්සීසී බැංකුව නමට ප්‍රසිද්ධ නොතාරිස් එස්. එම්. ගුණරත්න විසින් ලියා සහතික කරන ලද අංක 1830 සහ 1831 හා 2006.10.02 දින දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු ගෙවීම, "ජගත් ඇපරල්ස්" යන නාමය අභිධානය සහ ආයතනය යටතේ තනි අයිතිකරු ලෙස කැළණියේ ව්‍යාපාරය කරගෙන යන කැළණියේ, ජගත් චන්දන වීරසිංහ යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද 2008 ජූනි 30 වැනි දිනට ඉහත කී අංක 1830 හා 1831 දරන උකස් බැඳුම්කර මත ඉහත කී ජගත් චන්දන වීරසිංහ යන අයගෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් තිස් හතර ලක්ෂ හැත්තෑ එක් දහස් පන්සිය හැත්තෑ හතරකුත් ශත අනූ තුනක (රු.34,71,574.93) මුදලක් සහ 2008 ජූලි 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් විසිනව ලක්ෂයක් (රු.29,00,000) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන් මසකට වරක් ප්‍රතිශෝධනය කර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සතිපතා පදනම මත පළකරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ. ඩබ්. පී. ආර්.) වර්ෂයකට සියයට හතක් (7%) ඉහළ අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහළ 0.5% තීන්දු කරන අනුපාතිකය මත පොලිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් තිස්හතර ලක්ෂ හැත්තෑ එක්දහස් පන්සිය හැත්තෑ හතරකුත් ශත අනූතුනක (රු.34,71,574.93) මුදල සහ 2008 ජූනි 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් විසිනව ලක්ෂයක් (රු.29,00,000) සඳහා සෑම තුන්මසකට වරක් ප්‍රතිශෝධනය කර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සතිපතා පදනම මත පළකරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ. ඩබ්. පී. ආර්.) වර්ෂයකට සියයට හතක් (7%) ඉහළ අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහළ 0.5% ට තීන්දු කරන අනුපාතිකය මත පොලිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය සහ එහි ඇති චංචල පිරියත, යන්ත්‍රසූත්‍ර හා උපකරණ විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය අනුව හා එකී උකස් බැඳුම්කරයේ ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 1830 හා 1831 දරන උකස් බැඳුම්කර මගින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම සහ පරිශ්‍රය හා එහි ඇති චංචල පිරියත, යන්ත්‍රසූත්‍ර හා උපකරණ කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතුයැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

### අංක 1830 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ සියනෑ කෝරළේ, අධිකාරි පත්තුවේ, බියගම ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත, ගෝනවල පිහිටි, කඳවලකනත්ත, කඳවලවනාත නොහොත් කඳවලවත්ත සහ මිල්ලගහවත්ත නොහොත් කඳවල කුඹුර පිල්ලෑව යන ඉඩම් වලින් සංයුක්ත "කඳවල එස්ටේට්" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු පී. ඒ. කේ. ජේ. පෙරේරා විසින් මැන සාදන ලද අංක 4197 හා 2002 සැප්තැම්බර් 5 දින දරන පිඹුරේ දැක්වෙන, ලොට් අංක 12 ලෙස ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටිය වන, කොහල්විල පාර, වරිපනම් අංක 51/12 දරන බිම් කට්ටියට මායිම් උතුරට : (අඩි 12 ක් පළල පාරක් සඳහා වෙන් කළ) ලොට් අංක 13 ද, නැගෙනහිරට : ලොට් අංක 9 ද, දකුණට : (මීටර 1.0 ක් පළල කාණුව සඳහා වෙන්කළ) ලොට් අංක 15 ද, බස්නාහිරට : (අඩි 8 ක් පළල පාර සඳහා වෙන්කළ) ලොට් අංක 14 ද යන මායිම් ඇතුළත එකී අංක 4197 දරන පිඹුර ප්‍රකාර පර්චස් දහයක් (අ. 0, රූ. 0, පර්. 10) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි හා වෙනත් සියලු දේ.

මෙයට,

බලයලත් මිනින්දෝරු වී. එෆ්. ජේ. පෙරේරා විසින් මැන සාදන ලද අංක 8735 හා 1983.12.17 දින දරන පිඹුරේ ලොට් 2 බී ඉහත සඳහන් අංක 4197 පිඹුරේ ලොට් අංක 13. බලයලත් මිනින්දෝරු ජී. එල්. බී. නානායක්කාර විසින් මැන සාදන ලද අංක 9870 හා 1991.05.01 දින දරන පිඹුරේ ලොට් අංක 6 බලයලත් මිනින්දෝරු කේ. ඒ. රූපසිංහ විසින් මැන සාදන ලද අංක 646/1991 හා 1991.10.23 දින දරන පිඹුරේ ලොට් අංක 4 සී, යන බිම් කට්ටි තුළින්, මතින් සහ ඔස්සේ මාර්ග අයිතිය ද ඇතුළත් වේ.

### අංක 1831 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය

පහත සඳහන් චංචල පිරියත, යන්ත්‍රසූත්‍ර හා උපකරණ එනම් :-

| | විස්තරය | ප්‍රමාණය |
|---|---|---|
| 1. | සිංගර් නෝමල් 191 ඩී | 20 |
| 2. | ජුකී නෝමල් 5550 | 8 |
| 3. | ඩබල් නීඩ්ල්ස් 1162 එල්එච් | 7 |
| 4. | ෆීඩොක් ආම් | 2 |
| 5. | රිස් හෝල්ඩ් | 1 |
| 6. | බාර් ටැක් එල්කේ 1850 සහ එල්කේ 980 | 4 |
| 7. | කාන්සාඕ ස්පෙෂල් | 2 |
| 8. | ෆොන් ත්‍රෙඩ්/ෆයිව් ත්‍රෙඩ් ඕවර්ලොක් | 7 |
| 9. | ස්නැප් මැෂින් | 2 |
| 10. | ඇටෑචර් - ජුකි 780 එම් බී | 2 |
| 11. | බටන් හෝල්ඩ් ජුකී 780 එම් බී එච් | 1 |
| 12. | බොයිලර් අයන් ඇන්ඩ් බොයිලර් (නඕමොටෝ) | 3 |
| 13. | වැකුම් ටේබල් | 3 |
| 14. | කටිං මැෂින් (ඊස්ට්මන්) | 1 |
| 15. | පැඩ්ල් ලොක් 194348 කේ එස් | 1 |
| 16. | ෆියුසිං මැෂින් - ජිං ජෑං | 1 |
| 17. | බෑන්ඩ් නයිෆ් මැෂින් | 1 |
| 18. | චේන් ස්ටිච් මැෂින් | 1 |

ඇතුළුව කැළණිය, ගෝනවල, කොහොල්විල පාර අංක 498/1 දරන පරිශ්‍රයේ සහ/හෝ වෙනත් පරිශ්‍රයක දැනට තබා තිබෙන අමතර කොටස්, උපාංග සහ මෙවලම්.

ඒ. එන්. ෆොන්සේකා,
අධ්‍යක්ෂ/සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලු පාර,
කොළඹ 03.

10-853/3

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.